# දිගු ගමනක මුල් පියවර



රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි

BKT 0241
26/08/2023

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# දිගු ගමනක මුල් පියවර

ජනාධිපති ලේකම් කාර්යාල පුස්තකාලය
පරි. අං:......
-12-1996

15-12-1996

පොදු පෙරමුණ රජයට
වසර දෙකක් පිරීම නිමිත්තෙනි

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි

| | |
|---|---|
| පරි. අංක | |
| වර්ග අංකය | |
| දිනය | |

# දිගු ගමනක මුල් පියවර

"ගව් සිය ගණනක දුෂ්කර ගමනක් වුව ආරම්භ කළ යුත්තේ පළමු පියවරෙන් යයි කියමනක් තිබේ. යළිත් වරක් මේ රටේ නිදහස හා ප්‍රජාතන්ත්‍රය ස්ථාපිත කිරීම සඳහා යන ගමනේ පළමු පියවර පමණක් නොව තවත් පියවර ගණනාවක් ඉදිරියට තැබීමට ගෙවී ගිය වසර දෙකේ දී රජයට හැකිවිය.

දහසක් දුෂ්කරතා, බාධක හා කම්කටොළු මධ්‍යයේ වුව ද, මේ ගමනේ දී ජයග්‍රහණ රැසක් අත්පත් කර ගැනීමට දැනටමත් හැකිවී තිබේ. ප්‍රජාතන්ත්‍රවාදී නිදහස් සිවිල් සමාජයක් ගොඩනැගීම සඳහා පොදු ජන එක්සත් පෙරමුණු රජය තැබූ පියවර වලින් ලැබී ඇති සාර්ථක ප්‍රතිඵල ගැන ආඩම්බර විය හැකිය. මේ පියවර ශ්‍රී ලංකා ජනතාවගේ පමණක් නොව මුළුමහත් අන්තර් ජාතික ප්‍රජාවගේම පැසසුමට ලක් වී ඇති බව සඳහන් කිරීම අතිශයෝක්තියක් නොවේ. කුරිරු යුද්ධයේ කළුවළා පටල මැදින් වුව ද, බහුතර ජනතාවට නිදහසේ හුස්ම ගැනීමට හැකි පරිසරයක් ගොඩනැගීමට රජයට හැකි විය.


ජනාධිපතිනිය නිදහස් උළෙලේ උත්තමාචාරය පිළිගනිමින්

1995 ජනවාරි 6 වෙනිදා පාර්ලිමේන්තුවේ නව සැසි වාරය විවෘත කරමින් ජනාධිපතිනිය මේ රටේ ප්‍රජාතන්ත්‍රය නැවත ස්ථාපිත කිරීමේ කාර්යය ගැන කළ ප්‍රකාශය දැන් යථාර්ථයක් බවට පත් වී තිබේ. එතුමිය සිය කතාවේදී මෙසේ සඳහන් කළාය.

- මගේ ආණ්ඩුව ඉටු කළ පළමුවන කාර්යය වූයේ අපේ ජනතාව භුක්ති විඳින නිදහසේ මූලික හරයන්ට පහර නොවදින ලෙස කිසිම චකිතයකින් හෝ බියකින්, සැකයකින් හෝ තොරව කටයුතු කිරීමට අවස්ථාව උදා කිරීමයි. පුවත්පත් කලාවේදීන්, වෘත්තිකයින්, වෘත්තීය සමිති නායකයින් සරසවි සිසුන් පමණක් නොව පාසල් දරුවන් පවා මහ රෑ ඔවුන්ගේ නිවෙස් වලින් පැහැරගෙන ගොස් ටයර් සෑයවල පුළුස්සා මරා දමනු ලැබූ යුගය දැන් අවසන් වී ඇත.

- තම පවුල් වල ආදරණීය සාමාජිකයින් යුධ පිටියේ දී නොව අමු අමුවේ මරා දමනු ලැබීම නිසා දහස් ගණනක පවුල් විඳින ශෝකය සහ වේදනාව ගැන මගේ ආණ්ඩුව තියුණු ලෙස සංවේදී බව මෙහිදී කියනු කැමැත්තෙමි. යුධ අවි ගැටෙද්දීත් නීතියට ගොළුවන රැකිය නොහැකිය යන මූලධර්මය මගේ ආණ්ඩුව මහත් භක්තියෙන් සළකයි. රාජ්‍යයේ ක්‍රියාවන් ඉතාම දුෂ්කර අවස්ථාවලදී පවා නීතියට ඒකාබද්ධ විය යුතුය යන අදහස නිරන්තරයෙන්ම අවධාරණය කෙරෙන්නේ නැත්නම් සිවිල් සමාජයේ, අවසාන විග්‍රහයේ දී සමස්ථ ශිෂ්ඨාචාරයේම පදනම දෙදරා වැටීම අනිවාර්ය වනු ඇත.

ජනාධිපතිතුමියගේ මෙම ප්‍රකාශයේ සඳහන් කරුණු ගෙවුනු දෙවසරක කාලය තුළදී යථාර්ථයක් බවට පත් වූ බව සඳහන් කළ යුතුයි. මෙම කාලය තුළ ප්‍රජාතන්ත්‍රවාදී මිනිස් නිදහස දිනා ගැනීම අතින් ජනතාව ලබා ඇති ජයග්‍රහණ විමසා බැලිය යුත්තේ මීට දෙවසරකට කළින් පැවැති පාලන සමයේ දී පැවැති තත්ත්වය පසුබිම් කරගෙනය.

වසර 2500 ක ඉතිහාසය තුළ ශ්‍රී ලංකාවේ පෝෂණය වී වර්ධනය වූයේ ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායකි. බ්‍රිතාන්‍යයෙන් නිදහස ලත් පසුව ද ඒ පාලනයෙන් උරුම වූ ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායන් අප රටට මනා ලෙස ගැලපුනේ මෙරට ජනතාව උරුම කරගෙන තිබූ සුවිශේෂ නිදහස්කාමී සිතුම්පැතුම් නිසාය.

නිදහසින් පසු වරින් වර බලයට පත් වූ ආණ්ඩු මේ ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායන්ට අත තබන්නට කිසිදු වෑයමක් දැරුවේ නැත. එහෙත්, 1977 දී මේ තත්ත්වය වෙනස් විය. 1978 සම්මත කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඒකාධිපති මාවතකට පදනම වැටුනි. මන්ත්‍රීවරුන්ට පක්ෂ මාරු කිරීමට තිබූ නිදහස අහෝසි වී ගියේය. වැඩ වර්ජනයට ඇති අයිතිය මර්ධනය කෙරුණි. අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කළ සියළු දෙනා අමානුෂික මැර පහරදීම් වලට ගොදුරු වූහ. අධිකරණයේ ස්වාධීනත්වයට පවා තර්ජන එල්ලවිය. 1982 පැවැති ඊනියා ජනමත විචාරණයත් සමග මේ රටේ එතෙක් පැවැති ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායන් වල්මත් වන්නට පටන් ගත්තේය. මෙහි උච්ච අවස්ථාව උදාවූයේ 1983 කළු ජූලියත් සමගයි. රටේ මුළු ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන රටාවම වෙනස් කළේ කළු ජූලියත් සමග එදා රජය ආරම්භ කළ මර්ධන ව්‍යාපාරයයි. දකුණේ තරුණයෝ අවි අතට ගත්හ. උතුරේ ද්‍රවිඩ තරුණයෝ ද ඒ මහම ගියහ. මුළුමහත් සමාජය පුරා භීෂණ තත්ත්වයක් පැතිර ගියේය. විරුද්ධ මත මර්ධනය කෙරුණි. යෝධ ඒකාධිපති සෙවණැල්ලකින් මුළු මහත් සමාජය වැසී ගියේය. 1989 න් පසුව දකුණේ භීෂණය වඩාත් උච්ච අවස්ථාවට පත්විය.

1994 අගෝස්තු මහා මැතිවරණය වනවිට මේ රටේ මුළුමහත් ජනතාව භීෂණයෙන් හා රාජ්‍ය ත්‍රස්තවාදයෙන් හෙම්බත් වී සිටියහ. ප්‍රජාතන්ත්‍රවාදය ඉල්ලා තැනින් තැන ක්‍රමයෙන් වර්ධනය වෙමින් තිබූ උද්ඝෝෂණය වැඩිකල් යන්නට මත්තෙන් ප්‍රජාතන්ත්‍රවාදය ඉල්ලා නගන මහා හඬක් බවට පරිවර්තනය විය. ශිෂ්‍යයෝ, කම්කරුවෝ, ගොවි ජනතාව සහ බුද්ධිමතුන් යනාදී වශයෙන් සමාජයේ සෑම තරාතිරකම කොටස් ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් මහා හඬක් නැගූහ. මේ ජනතා උද්ඝෝෂණයට නායකත්වය දුන්නේ පොදු ජන එක්සත් පෙරමුණේ නායිකාව වූ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියයි.

ප්‍රජාතන්ත්‍රවාදී නිදහස යළි ස්ථාපිත කරන බව එතුමිය මැතිවරණ හතරක් ඔස්සේ ජනතාව හමුවේ තැබූ ප්‍රතිඥාව විය. දකුණු පළාත් සභාව සහ බස්නාහිර පළාත් සභාව සඳහා පැවැත් වූ මැතිවරණ වලදී මෙන්ම අගෝස්තු මැතිවරණයේ දී හා ඉන් පසුව එළැඹි ජනාධිපතිවරණයේ දී ද එතුමිය මෙම පොරොන්දුව ජනතාව හමුවේ තැබූවාය. ගෙවුනු දෙවසරක කාලය තුළ ජනාධිපතිතුමියත් පොදු ජන එක්සත් පෙරමුණු රජයත් එම ප්‍රතිඥාව ඉටු කිරීම සඳහා ප්‍රතිඵලදායී පියවර රැසක් ගෙන ඇත.

වත්මන් රජය බලයට පත්වන විට ශ්‍රී ලංකාවට අන්තර් ජාතික වශයෙන් එල්ල වී තිබූ ප්‍රධාන චෝදනාවක් වූයේ පැවති රජය මානව හිමිකම් දරුණු ලෙස උල්ලංඝණය කරන ලද බවයි. මේ තත්ත්වය වෙනස් කිරීමට ජනාධිපතිතුමියට වැඩි කලක් ගත වූයේ නැත. මෙහිලා ශ්‍රී ලංකා රජය තැබූ වැදගත්ම පියවර වූයේ මානව හිමිකම් කොමිසමක් පිහිටුවීමේ නීති රීති ප්‍රකාශයට පත් කිරීමයි. මේ පිළිබඳ පණත ද දැන් පාර්ලිමේන්තුවෙන් සම්මත වී ඇත. කොමිසම සාමාජිකයින් 5 දෙනෙකුගෙන් සමන්විතය.

මීට අමතරව මානව හිමිකම් සුරැකීමට අදාළ නීති රීති ගණනාවක් පසුගිය දෙවසර තුළ ක්‍රියාවට නංවා ඇත. වධ බන්ධන වැළැක්වීමේ එක්සත් ජාතීන්ගේ සම්මුතියට අනුකූලව විධි විධාන යෙදීමේ අරමුණින් පාර්ලිමේන්තුවේදී නීති රීති සම්මත කර ගැණුනි. විදේශීය රටක් විසින් ඉල්ලා සිටිනු ලබන සැකකරුවෙකු එරටට භාර දීම පිළිබඳ නීතිය ද සංශෝධනය කෙරුණි. පසුගිය පාලන සමයේ දී ඇති වූ භීෂණය නිසා අතුරුදහන් වූ හෝ මියගිය හෝ සංඛ්‍යාව අති විශාලය. මොවුන් පිලිබඳ මරණ සහතික ලබා ගැනීමට තිබූ දුෂ්කරතාව ඉවත් කෙරුණි. ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ රඳවා ගෙන සිටින සංඛ්‍යාව සොයා බැලීම හා අදාළ පුද්ගලයින් කවුරුන්දැයි හඳුනා ගැනීම සඳහා කමිටුවක් පත් කිරීම ද ප්‍රජාතන්ත්‍රවාදී නිදහස ස්ථාපිත කිරීමට ගත් තවත් පියවරකි. භීෂණ සමයේ දී අතුරුදහන්වූ තරුණ තරුණියන් පිළිබඳව සොයා බැලීම සඳහා ජනාධිපතිතුමිය කොමිෂන් සභා තුනක් පත් කළාය. මේ කොමිෂන් සභාවල වැඩකටයුතු දැන් බොහෝ දුරට නිම වෙමින් පවතී. ඇතැම් කොමිසම් වල කාලය දීර්ඝ කිරීමට ද රජයට සිදුවිය. මෙහි අරමුණ වන්නේ අතුරුදහන්වූවන් පිළිබඳව ඇති තතු සොයා බලා අවශ්‍ය සහන සැළසීමයි. මානව හිමිකම් සුරැකීමේ අරමුණින් මානව හිමිකම් කාර්ය සාධක බලකායක් ද දැන් පිහිටුවා තිබේ. අත් අඩංගුවට ගනු ලබන අයගේ මූලික අයිතිවාසිකම් සහතික කිරීම මෙම කමිටුවට පැවරෙන කාර්යයයි. මීට අමතරව මානව හිමිකම් ප්‍රශ්න වලදී විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයට සහායවීම සඳහා උපදේශක කමිටුවක් ද පත්කොට ඇත.

ප්‍රජාතන්ත්‍රවාදය යළි සහතික කිරීම සඳහා දුන් ප්‍රතිඥාව ඉටු කිරීම සඳහා රජය තැබූ තවත් වැදගත්ම පියවරක් වන්නේ මාධ්‍ය නිදහස සහතික කිරීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ගයයි. ගෙවුනු දෙවසරක කාලය තුළ පොදු ජන එක්සත් පෙරමුණු රජය මාධ්‍ය නිදහස සහතික කිරීම සඳහා දුන් පොරොන්දු ඉටු කර ඇති බව පෙනී යන්නේ එදත් අදත් පවතින තත්ත්වය සසඳා බලන විටයි. එදා මාධ්‍ය නිදහස හුදෙක් ව්‍යවස්ථාවට පමණක් සීමා විය. මාධ්‍ය නිදහස භුක්ති විඳීමට අවශ්‍ය පරිසරය එදා තිබුණේ නැත. ඊට හේතුව සෑම මාධ්‍ය ආයතනයක්ම අදිසි හස්තයකින් දැඩි පාලනයකට නතු කර තිබීමයි.

අද මෙන් ජනාධිපතිතුමිය හා රජය විවේචනය කිරීමේ පූර්ණ නිදහසක් එදා තිබුණේ නැත. අද මේ නිදහස කොතරම් පුළුල්ව භුක්ති විඳීමට හැකියාව තිබෙන්නේ ද යත් ඇතැම් ජනමාධ්‍ය ආයතන මෙම නිදහසින් අයුතු ප්‍රයෝජන ගෙන ඇති බව පෙන්වා දිය යුතුව ඇත. දේශපාලනමය ප්‍රතිපත්ති හෝ රජයේ ආයතන වල වැඩකටයුතු හෝ විවේචනය කරනවා වෙනුවට චරිත ඝාතන හා පෞද්ගලික මඩ ගැසීම් දක්වා වූ පහත් මට්ටමකට ඇතැම් ජනමාධ්‍යකරුවෝ පත්ව සිටිති. යුද්ධය පිළිබඳව පළ කරන ප්‍රවෘත්ති වලදී පවා මේ ජනමාධ්‍ය ආයතන වගකීමකින් තොරව ක්‍රියා කරන බව පෙනේ. ජනමාධ්‍ය නිදහස ක්‍රියාත්මක කිරීමේ දී නිදහස මෙන්ම වගකීම ද අවශ්‍ය වේ. මේ දෙක අතර තුලනාත්මක බව අත්‍යාවශ්‍ය වන්නේය.

මැතිවරණයේ දී පොරොන්දු වූ පරිදි මාධ්‍ය නිදහස මර්ධනය කිරීමට තුඩුදෙන නීතිමය පසුබිම ඉවත් කිරීමට ද පියවර ගෙන ඇත. මාධ්‍යවේදීන්ගේ වෘත්තීය තත්ත්වය නංවාලීමේ අරමුණින් පත්කළ කමිටු වාර්තා දැන් නිකුත් වී අවසන්ය. ජනමාධ්‍ය පුහුණු ආයතනයක් පිහිටුවීම, ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීය තත්ත්වය නංවාලීම, ඔවුන්ගේ වැටුප් හා දීමනා පිළිබඳව සළකා බැලීම හා මාධ්‍ය නිදහසට තර්ජන එල්ලවන අණ පණත් සංශෝධනය කිරීම ආදී කරුණු සොයා බැලීම මේ කමිටු වලට පැවරී තිබුනි.

පසුගිය පාලන සමයේ දී අසාධාරණ පළිගැනීම් වලට ලක් වූ සේවක ජනතාවට සහන සැළසීම සඳහා ගත් පියවර ද ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීමේ වැඩ

පිළිවෙලේම කොටසක් ලෙස හඳුන්වාදිය හැකිය. 1977 මහා මැතිවරණයෙන් පසුව අසාධාරණ පළිගැනීම් වලට ලක්වූවන්ට මෙන්ම 80 වැඩවර්ජනයෙන් රැකියා අහිමිවූවන්ට ද බොහෝ සහන සළසා ඇත. මෙම කටයුතු රජයම දෙවසරක් පිරෙන අවස්ථාවේ අංග සම්පූර්ණ කොට තිබිය යුතු බවට රජය අදාළ බලධාරීන්ට නියෝග කොට ඇත. තමන්ට සිදුවී ඇති අසාධාරණකම් පිළිබඳව පැමිණිලි කිරීම සඳහා ඔම්බුඩ්ස්මන්වරයෙකු පත් කිරීම, ළමා හා කාන්තා අයිතිය සුරැකීම සඳහා අණ පණත් සම්මත කිරීම සහ සේවක උපදේශක සභා පිහිටුවීම ආදී නීතිමය ක්‍රියා මාර්ග තුළින් ද මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයකට අවශ්‍ය පදනම සකස් කෙරුණි.



ජාතික තොරතුරු මධ්‍යස්ථානය විවෘත වූ දින . . .

හිංසනය නැතිකොට ප්‍රජාතන්ත්‍රවාදී නිදහස යළි ස්ථාපිත කිරීම සඳහා පොදු ජන එක්සත් පෙරමුණු රජය ගත් අනෙක් අද්විතීය පියවර වන්නේ දේශපාලන ඝාතන පිළිබඳව සොයා බැලීම සඳහා කොමිෂන් සභා පත් කිරීමයි. විජය කුමාරතුංග, ලලිත් ඇතුලත්මුදලි හා ඩෙන්සිල් කොබ්බෑකඩුව සහ දේශපාලන සහ හමුදා නායකයන් ඝාතනය කිරීමට තුඩුදුන් කරුණු සොයා බැලීම සඳහා පත් කළ කොමිෂන් සභා වලදී හෙළිවී ඇති කරුණු විස්මය ජනකය. විජය කුමාරතුංග කොමිසමේ වාර්තාව මේ වනවිට නිකුත්වීමට නියමිතය. ලලිත් ඇතුලත්මුදලි හා ඩෙන්සිල් කොබ්බෑකඩුව කොමිෂන් සභා වලදී හෙළි වී ඇත්තේ පසුගිය රජයේ බලවතුන් ක්‍රියා කර ඇති ආකාරයයි. එල්.ටී.ටී.ඊ. සංවිධානයට අවි ආයුධ හා මුදල් ලබාදුන් අන්දම ද දැන් සක්සුදක් සේ පැහැදිලිය. බටලන්ද වධකාගාරය පිළිබඳව සොයා බැලීම සඳහා පත්කළ කොමිෂමේ දී හෙළි වන කරුණු ඉදිරියේ තම වගකීමෙන් මිදෙන්නට බොහෝ දෙනෙකුට නොහැකිය. පසුගිය රජයේ මැති ඇමති තනතුරු දැරූ බොහෝ දෙනා පිළිබඳව මෙම කොමිෂන් සභා වලදී හෙළිවී ඇති තොරතුරු අනුව අදාළ වගකීමෙන් මිදෙන්නට ඔවුනට නොහැකිය. මෙම කොමිෂන් සභා පත් කිරීමේ අරමුණ වූයේ මෙතෙක් සිදු වූ මිනීමැරුම් හා හිංසන තත්ත්වයන් පිළිබඳ තොරතුරු ජනතාව හමුවේ හෙළිදරව් කිරීමට අමතරව ඉදිරියේ දී මෙවන් තත්ත්වයක් යළි කිසි දිනෙක ඇති නොවීමට අවශ්‍ය පදනම දැමීමයි. එවැනි පදනමක් දැමීම මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී සිවිල් සමාජයක් යළි ගොඩ නැගීමේ කාර්යය සඳහා අත්‍යවශ්‍ය වන්නේය.

ප්‍රජාතන්ත්‍රවාදය යළි ස්ථාපිත කිරීමේ අරගලයේ තවත් වැදගත් පියවරක් වූයේ පිරිසිදු මැතිවරණ පැවැත්වීමට අවශ්‍ය පරිසරය සකස් කිරීමයි. 1977 න් පසුව මේ රටේ පැවැති මැතිවරණ රාශියකම වංචා සිදු වූ බව රහසක් නොවේ. 1982 පැවැති ජනමත විචාරණයත් සමග පාර්ලිමේන්තුවේ කාලය දීර්ඝ කෙරුණු අතර, ඒ ජනමත විචාරණය පැවැත් වූ අන්දම මැතිවරණ කොමසාරිස්වරයාගේ දැඩි අප්‍රසාදයට ලක්විය. මැතිවරණ වලදී හොර ඡන්ද දැමීම සාමාන්‍ය සිද්ධියක් බවට පත්විය. මැතිවරණයක දි ප්‍රචණ්ඩක්‍රියා සිදුවීම ප්‍රජාතන්ත්‍රවාදයේ ජීවනාලිය දුර්වල කිරීමකි. මෙවැනි තත්ත්වයක් යළි ඇති නොවීමට වග බලාගනු සඳහා පොදුජන එක්සත් පෙරමුණු රජය පරීක්ෂණ කොමිෂමක් පිහිටුවිය. නැගෙනහිර පළාතේ සිදු වූ මැතිවරණ දූෂණ සොයා බැලීම සඳහා පත් කළ ජනාධිපති කොමිෂම ඉදිරියේ හෙළි වන කරුණු අනුව එදා ප්‍රජාතන්ත්‍රවාදයට

එල්ල වී තිබූ තර්ජනය කොතෙක් දැයි සිතා ගතහැකිය. ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණ පිළිබඳ සෑම මූලධර්මයක්ම එදා හිතුමතේ උල්ලංඝනය කරනු ලැබීය. මේ පිළිබඳව පැවැත්වෙන කොමිෂන් සභා සාක්ෂි විභාගය මේ රටේ ප්‍රජාතන්ත්‍රය හා පාර්ලිමේන්තු සම්ප්‍රදාය යළිත් ස්ථාපිත කිරීම සඳහා ගත් අතිශය වැදගත් පියවරකි.

ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් යළි ස්ථාපිත කිරීමේ අග්‍රගන්‍ය පියවර වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයයි. මෙම ව්‍යවස්ථා සංශෝධනය අරමුණු දෙකක් පෙරදැරි කරගෙන සිදු වේ. ඉන් පළමු අරමුණ වන්නේ වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයකට උචිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කර ගැනීමයි. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කොට පාර්ලිමේන්තුවට බලතල පවරා දෙන බවට පොදුජන එක්සත් පෙරමුණ මැතිවරණයේ දී දුන් ප්‍රතිඥාව ඒ ආකාරයෙන්ම ඉටු කරනු ඇත. මෙම සංශෝධනය කළයුතුව ඇත්තේ හදිසියේ පැලැස්තර ආකාරයකට නොව ඉතාම විධිමත් හා ක්‍රමානුකූල ආකාරයටයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තැනින් තැන සිදු කෙරෙන සංශෝධන මගින් මෙය කළ නොහැකිය. සමස්ථ ව්‍යවස්ථාවටම ප්‍රජාතන්ත්‍රවාදී පදනමක් ලැබෙන අයුරින් එය කළයුතුය.

බලය බෙදා හැරීමේ වැඩපිළිවෙල අදාළ වන්නේ ද මෙහිදීය. රජය දේශපාලන විසඳුම් යෝජනා මාලාවක් ඉදිරිපත් කර ඇත්තේ හුදෙක් ජනවාර්ගික ප්‍රශ්ණයට විසඳුමක් වශයෙන් පමණක් නොවේ. මෙය දකුණේ ජනතාව ඇතුළු සමස්ථ ජනතාවම රාජ්‍ය පාලනයේ කොටස්කරුවන් බවට පත්කර ගන්නා වැඩපිළිවෙලකි. බලය බෙදා හැරීම තුළින් සාමය, ප්‍රජාතන්ත්‍රවාදය, නිදහස, සාමානාත්මතාව මෙන්ම සියළු දෙනාගේ සමාන අයිතිවාසිකම් ද සුරැකේ.

දකුණේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් මෙසේ තහවුරු කෙරෙන අතර, උතුරේ සහෝදර ද්‍රවිඩ ජනතාව ඒකාධිපති පැසිස්ට් විලංගුවෙන් නිදහස් කර ගැනීමේ විමුක්ති අරගලය ද ජයග්‍රහණයෙන් කෙළවර වෙමින් තිබීම කාගේත් සතුටට කරුණකි. 13 වසරක කාලයක් මුළුල්ලේ ජය ගැනීමට නොහැකිව තිබූ යුද්ධය දැන් සාර්ථක ලෙස ඉදිරියට යමින් පවතී. යාපනය නගරය හා ඒ අවට ප්‍රදේශ දැන් රජයේ පාලනය යටතේ පවතී. මෙය ද සාමය, නිදහස හා ප්‍රජාතන්ත්‍රය සඳහා ගෙන යන අරගලයේ ම කොටසකි

මේ අනුව ගෙවුනු දෙවසර තුළ ක්‍රියාත්මක කෙරුනු සෑම ක්‍රියා මාර්ගයකින්ම මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී නිදහස යළි ස්ථාපිත වී ඇති බව පැහැදිලිය. වෙනත් රටවල මෙ අන්දමින් ප්‍රජාතන්ත්‍රවාදී නිදහස දිනා ගැනීම සඳහා ලේ හැලීමට සිදුවිය. ඒකාධිපති රටවල ජනතාව තමන්ගේ අයිතිවාසිකම් දිනා ගත්තේ විප්ලවීය අරගල තුළිනි. එහෙත් ශ්‍රී ලංකාවාසී ජනතාවට ඉතා කෙටි කාලයක් තුළ දී මෙම නිදහස දිනා ගැනීමට හැකිවිය. මෙම ජයග්‍රහණයේ ඉතාමත් කැපී පෙනෙන ගුණාත්මක අගයක් තිබේ. අද ජන සමාජය පුරා පැතිර පවත්නා සරළ සැහැල්ලු නිදහස් පරිසරය ගෙවුනු දෙවසර මුළුල්ලේ රජයත් ජනතාවත් ගෙනගිය අඛණ්ඩ අරගලයේ ප්‍රතිඵලයකි.

21 වන සියවසට ගැලපෙන අයුරින් නව සමාජයකට පදනම දැමීමටත් එම සමාජය සඳහා මේ රටේ ජනතාව පුරුදු පුහුණු කිරීමටත්, අවශ්‍ය පියවර තබා අවසන්ය. වත්මන් රජය යටතේ මෙකී ජයග්‍රහණයන් ලැබී නැතැයි අභියෝග කිරීමට නොහැකිය. තවත් විසඳීමට ඉතිරිව ඇති දහසකුත් එකක් ගැටළු මධ්‍යයේ වුව ජනතාව ලබා ඇති මේ නිදහස ගැන කාටත් ආඩම්බර විය හැකිය.

# විදේශ ප්‍රතිපත්තිය

1994 බලයට පැමිණි පොදු පෙරමුණු ආණ්ඩුව අන්තර්ජාතික ක්ෂේත්‍රයේ මුහුණ දුන් ප්‍රබලතම අභියෝගය වූයේ ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් වාර්තාවේ යහපත් පරිවර්තනයක් ඇති කොට හැකිතරම් මිතුරන් දිනා ගනිමින් ජනවාර්ගික ප්‍රශ්නය විසඳීමට අවශ්‍ය අන්තර්ජාතික වාතාවරණය සකස් කරන අතර, ආර්ථික සංවර්ධනයට අවශ්‍ය විදේශ ආයෝජන ඇද ගැනීමට පසුබිම සැකසීමය. මේ අභියෝගය ජය ගැනීම සඳහා ඉවහල්වන අයුරින් දේශීය ප්‍රතිපත්ති හඳුන්වාදීම ප්‍රථමයෙන් කළයුතු විය. දිගු කලක් මෙරට සමාජය ගොදුරු කරගෙන සිටි දේශපාලන භීෂණය තුරන් කිරීමේ මුල් පියවර ලෙස මැතිවරණයෙන් පසු විරුද්ධවාදීන් ශාරීරික හා මානසික වශයෙන් පෙළීම නතර කරනු ලැබීය. හදිසි නීතිය උතුරු නැගෙනහිරට හා තවත් ප්‍රදේශ කිහිපයකට සීමා කෙරිණ. ජනමාධ්‍යයට පුළුල් නිදහසක් ලැබිණ. අධිකරණයේ ස්වාධීන ක්‍රියාකාරිත්වයට ඇඟිලි ගැසීම නතර විය. ආරක්ෂක හමුදා සහ පොලීසිය දේශපාලන අරමුණු සපුරා ගැනීම සඳහා උපයෝගී කොට ගැනීම තවදුරටත් සිදුවූයේ නැත.



ජනාධිපතිනිය CNN වාර්තාකරුවන් සමග

උතුරු නැගෙනහිර යුද්ධය අරභයා ආරම්භයේ සිටම පොදු පෙරමුණ පිහිටා සිටි ස්ථාවරය වූයේ එය ජනවාර්ගික ප්‍රශ්නයක් බවත්, ඊට ඇති අවසාන විසඳුම දේශපාලනමය එකක් බවත්ය. බෙදුම්වාදී ත්‍රස්තවාදය ජනවාර්ගික ප්‍රශ්නයේ අතුරු ඵලයකැයි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය අගමැතිනිය ලෙස දිවුරුම් දීමෙන් පසු මුල් වරට දෙස් විදෙස් මාධ්‍යවේදීන් අමතමින් කියා සිටියාය. උතුරට පනවා තිබූ භාණ්ඩ තහනම හැකි පමණින් ඉවත් කළ රජය ජනාධිපතිවරණයට පෙරම එල්.ටී.ටී.ඊ. සංවිධානය සමඟ සාකච්ඡා ආරම්භ කළේය.

එල්.ටී.ටී.ඊ. ය 1995 අප්‍රේල් 19දා ඒක පාර්ශ්විකව සටන් විරාමය බිඳ දැමූ විට ද රජය ජනවාර්ගික ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් සෙවීමේ ප්‍රයත්නය අත් හලේ නැත. කලින් රජයේ නායකයන් මෙන් සර්ව පාක්ෂික සමුළු කැඳවමින් ප්‍රශ්නය මගහැර යාමට තැත් කළේ ද නැත. පොදු පෙරමුණ රජය සිය විසඳුම 1995 අගෝස්තු 03 වැනිදා ප්‍රකාශයට පත් කළේය.

මේ ක්‍රියාදාමයන් සන්නිවේදන මාධ්‍ය ඔස්සේ කෙමෙන් සෙසු රටවලට දැන ගන්නට ලැබෙන අතර, ජනාධිපතිනිය හා විදේශ ඇමති ලක්ෂ්මන් කදිරගාමර් මහතා තමන් කළ විදේශ චාරිකා වලදී පොදු පෙරමුණු රජයේ මෙකී පිළිවෙත්, ලෝකයට පැහැදිලි කර දුන්හ. කදිරගාමර් මහතාගේ කාර්ය සාධනය හෙන්රි කී සිංගර්, රිචඩ් හෝල්බෲක් වැන්නවුන්ගේ රාජ්‍ය තාන්ත්‍රික විශද බව සිහි ගන්වන සුළුවිය. 1995 මාර්තු

මාසයේ කෝපන්හේගන් නුවර පැවති සමාජ සංවර්ධනය පිළිබඳ ලෝක නායක සමුළුවේදීත් 1995 ඔක්තෝබර් මාසයේ නිව්යෝක් නුවර පැවැති එක්සත් ජාතීන්ගේ ස්වර්ණ ජයන්තියේ දීත් ජනාධිපතිනිය කළ කථා ශ්‍රී ලංකාවේ නව ගමන් මග, පිළිගත් මානව අයිති වාසිකම්, ප්‍රජාතන්ත්‍රවාදය හා මානුෂවාදය සමග සැසඳෙන අයුරු ලෝකයාට වටහා දීමට ආධාර වූයේය.



ශ්‍රී ලංකා ජනාධිපතිනිය එක්සත් ජාතීන්ගේ සංවිධානය අමතමින් . . .

වැඩිකල් නොගොස් මේ ව්‍යායාමයේ ප්‍රතිඵල ලැබෙන්නට විය. ශ්‍රී ලංකාව තම වැසියන් මරා මහමඟ දමා පුළුස්සන රටක් ලෙස මානව අයිතිවාසිකම් ක්ෂේත්‍රයේ තවරා ගෙන තිබූ විශාල කළු පැල්ලම් කෙමෙන් මැකී ගියේය. ඇමෙරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුව, ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් ආයතනය, එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් කොමිසම, ඒෂියා වොච් බඳු මානව අයිතිවාසිකම් ව්‍යාපාර, ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් වාර්තාව කෙටි කලක් තුළ බොහෝ සෙයින් සතුටුදායක අතට හැරී ඇතැයි නිගමනය කෙළේය. මෙරට මානව අයිතිවාසිකම් කඩ කරන්නා ලෙස ඉන් පසු ඇඟිල්ල දිගු වූයේ ආණ්ඩුව දෙසට නොව එල්.ටී.ටී.ඊ. සංවිධානය දෙසටය.



ජනාධිපතිනිය ජපන් අධිරාජයා සමඟ

ජනවාර්ගික ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් සෙවීමට ශ්‍රී ලංකාවේ නව රජයට සැබෑ අවශ්‍යතාවක් ඇති බවත්, එල්.ටී.ටී.ඊ සංවිධානයේ අනම්‍ය පිළිවෙත් හා කුරිරු මිනිස් ඝාතන ඊට ප්‍රධාන බාධකය බවත් අන්තර්ජාතික ප්‍රජාව පිළිගන්නට වූහ. ඇමරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුව එල්.ටී.ටී.ඊ.ය ප්‍රථම වරට ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස නම් කෙළේය. කැනඩාව, ඕස්ට්‍රේලියාව හා ජර්මනිය වැනි එල්.ටී.ටී.ඊ කෙළිබිම්වල ඔවුන් පිළිබඳව කලින් තිබූ ආකල්පය හා ප්‍රසාදය වෙනස් වී ඇති බව පැහැදිලිව පෙනී ගියේය. මැලේසියාව සිය භූමිය තුළ එල්.ටී.ටී.ඊ ක්‍රියාකාරකම් තහනම් කරන නියෝග පැනවීය. එරට ජනගහනයෙන් දෙමළ බස කථා කරන පිරිස සියයට 9 ක් බව සඳහන් කළ යුතුය. ඉන්දියාව එල්.ටී.ටී.ඊ අවි මිළදී ගැනීම් හා ප්‍රවාහනය පිළිබඳ රහස් තොරතුරු ශ්‍රී ලංකාවට නිතර දැනුම් දීමට තරම් කුළුපග විය. තමා හා එල්.ටී.ටී.ඊ අතර මිත්‍රත්වය අතීතයට අයත් සිදු වීමකැයි තමිල්නාඩු මහ ඇමති කරුණානිධි ප්‍රසිද්ධියේ කියා සිටියේය. ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදාවල ප්‍රහාරයෙන් හෙම්බත්වූ කොටි නායකයන් ප්‍රශ්නයට මැදිහත් වන ලෙස නොබෝදා කළ ඉල්ලීම අමෙරිකාව විසින් ඉවත දමනු ලැබීය. යළි ආරම්භ වූ යුද්ධය සඳහා අවි සපයා ගැනීම වත්මන් රජයට දැන් පෙර රජයට මෙන් දුෂ්කර කර්තව්‍යයක්

නොවේ. "අපට කවුරුවත් අපි විකුණන්නේ නෑ" යි ජනාධිපති ජයවර්ධන වරක් මැසිවිලි කීය.

ජනාධිපතිනිය සිය විදේශ ඇමතිවරයා සමග ප්‍රංශයේ, චීනයේ සහ ජපානයේ කළ චාරිකා මෙන්ම විදේශ ඇමතිවරයා හා තනිව කළ එතෙර චාරිකා සහ මෙහි පැමිණි විදේශීය ප්‍රභූන් සමග කළ කතා බහ ද බිඳ වැටී තිබූ ශ්‍රී ලංකා ප්‍රතිරූපය යළි ගොඩ නැගීමට ඉවහල් වූ බවට පැහැදිලි සාක්ෂි තිබේ. ජපානය ශ්‍රී ලංකාවට ප්‍රදානය කිරීමට එකඟ වූ රුපියල් කෝටි 2000 කට අධික ණය හා ආධාර මුදල එක් සාක්ෂියක් පමණි. ඉන්දීය සාගරයේ පිහිටි ශ්‍රී ලංකාව නම් වූ කුඩා දිවයින් රාජ්‍යය වාර්ගික වෛරයෙන් බැඳී උනුනුත් මරා ගන්නා දේශයක් නොව ප්‍රඥාවන්ත දේශපාලන නායකත්වයක් යටතේ ස්වකීය අභ්‍යන්තර ප්‍රශ්න ශිෂ්ට සම්මත දේශපාලන ක්‍රියා මාර්ග ඔස්සේ විසඳා ගනිමින් මනුෂ්‍ය අභිමානය හා සැසඳෙන උසස් ආර්ථික හා සමාජ මට්ටමක් කරා ළඟා වීමට උත්සාහ කරන ජාතියකැයි යන හැඟීම ලෝක ප්‍රජාවගේ හදවත් තුළ රෝපණය කැරවීමට පොදු පෙරමුණු රජයේ විදේශ පිළිවෙත් හා ක්‍රියාමාර්ග සමත් වී ඇත.

රටක් සමෘද්ධිය කරා ළඟා වීමට ආර්ථික, සමාජ හා සංස්කෘතික සංවර්ධනය එක්ව බැඳී සිටිය යුතු වේ.

මෙම මහා ජාතික කර්තව්‍යයේ දී ජනතාවගේ ජීවන තත්ත්වයන් ශක්තිමත් හා තිරසාර ලෙස නංවාලීම කෙරෙහි ප්‍රමුඛතාවය දිය යුතු වේ. මේ සඳහා අධ්‍යාපන, සෞඛ්‍ය, පෝෂණ, රැකියා, පරිසරය සහ සමාජ සුභ සාධන සේවා වෙත නිරන්තර අවධානය යෙදිය යුතු වේ.

සියයට හැටක් පමණ වන ශ්‍රී ලාංකික දුගී කොටස්වල, ස්ත්‍රී පක්ෂයේ හා දරුවන්ගේ ජීවන තත්ත්වය නංවාලීම සමෘද්ධියේ අරුත වෙයි. පසුගිය 17 වසර තුළ මෙම අවශ්‍යතාවයන් කෙරෙහි දක්වා තිබුණේ ඉතා උදාසීන තත්ත්වයකි.

මේ හේතුව නිසාම අප රටේ ජනතාවගෙන් 62% ක් වන විශාලතම ජන කොටසක් වත්මන් රජය බලයට පත් කිරීමට විශාල ජන වරමක් දී ඇත.

1995 ජනවාරි 06 සහ 1996 පෙබරවාරි 09 දින දී පාර්ලිමේන්තුවේ නව සැසිවාර විවෘත කරමින් කළ දේශන මගින් පවත්නා කණගාටුදායක තත්ත්වය මඟ හරවා සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කළ ජනාධිපති ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග මැතිනිය ශ්‍රී ලංකාවේ ආර්ථික හා මානව සම්පත් සංවර්ධනය කිරීමෙන් නව යුගයක් කරා ශ්‍රී ලංකාව මෙහෙයවීමට ප්‍රතිඥා දී ඇත.

එක්කෝටි අසූ අට ලක්ෂයකට ආසන්න ජනතාවක් වෙසෙන ශ්‍රී ලංකාවේ මානව සංවර්ධන ක්ෂේත්‍රයේ ජනගහනය ජාත්‍යන්තර කීර්තියට පත් වූ එකක් වේ. අවුරුදු 70 කට අධික ජීවිත අපේක්ෂාව සියයට 90 කට අධික සාක්ෂරතාව, සියයට 75 ක් ද්විතීය අධ්‍යාපනයට ඇතුළුවීම හා සියයට 90 ක් ප්‍රාථමික අධ්‍යාපනයට සහභාගිවීම මීට අදාළ සමහර දත්තයන්ය. 1950 සිට 1980 දක්වා කාලය තුළ අධ්‍යාපන සෞඛ්‍ය හා සුභ සාධනය සඳහා වූ වියදම දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 9 සිට 10 දක්වා වුවත් 1990 ගණන් වලදී ඉතා අවාසනාවන්ත ලෙස මෙය 06% දක්වා පහත වැටී ඇත. මෙය රජයේ මුළු වියදමේ ප්‍රතිශතයක් ලෙස බලනවිට සියයට 15 සිට 05 දක්වා අඩුවීමකි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය පිරිහීමට පත්විය. එකල පාසල් හා පළාත් අතර සම්පත් බෙදීයෑම දිගින් දිගටම පහත බැස ගොස් තිබේ. ශ්‍රී ලංකාවේ මානව හා ආර්ථික සම්පත් දිවයිනේ විවිධ පළාත් වල බෙදී යාමේ දී ඉතා දරුණු ලෙස විෂමාකාරව බෙදී ගොස්

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

ඇත. දිවයිනේ ඉතාමත් දුගී පෙදෙස් නොසලකා හැර ඇති පසුගිය රජය මේ සියළු සම්පත් වලින් ඉතා වැඩි කොටසක් බෙදා හැර ඇත්තේ වඩාත් සමෘද්ධිමත් පළාත්වලටමය මිස බහුතරයක් දුගී ජනතාව වෙසෙන පෙදෙස් කරා නොවේ. ගැමි පෙදෙස්වල ඉතා දුගී ජනතාව අතර, මන්දපෝෂණය ලෙඩ රෝග වසංගත පැතිරී ගියත් පසුගිය රජය එම තත්ත්වයන් තුරන් කිරීමට පියවරක් ගෙන නැත.

මෙම තත්ත්වය කෙරෙහි විශේෂ අවධානය යොමුකළ වත්මන් රජය අධ්‍යාපනය, සෞඛ්‍ය ඇතුළු මානව සම්පත් හා ආර්ථික සංවර්ධනය ද ඇති කොට යළි ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ සංවර්ධිත රටක් බවට පත් කිරීමේ අධිෂ්ඨානයෙහි පිහිටා ඇත. මෙම රජය බලයට පත් වී පසුගිය වසර දෙක තුළ මේ සඳහා ගෙන ඇති පියවර පිළිබඳව මෙහිදී සාකච්ඡා කිරීම ඉතා වැදගත්ය.

# සමෘද්ධිය කරා මානව සම්පත් සංවර්ධනය කිරීම.

## අධ්‍යාපනය

සමෘද්ධිමත් ජනතාවක් සහිත රටක් ලෝකයේ ඉහළ තැනකට පත්වීම ස්වභාවිකය. සියයට 90 ක පමණ සාක්ෂරතාවයක් ඇති ශ්‍රී ලංකාව වැනි රටකට මෙවැනි තත්ත්වයකට ලංවීම කිසිසේත් අපහසු නොවේ. සමාජ සංවර්ධනයෙහිලා අධ්‍යාපනය ඉහළ ප්‍රමුඛත්වයක් ගනී. ජනතාවගේ බුද්ධි මට්ටම වර්ධනය කිරීම තුළින් තිරසාර නිවැරදිව තීරණ ගැනීමේ හැකියාව ඇතිවෙයි. එමගින් සමාජ ප්‍රශ්න සඳහා සාර්ථකව මුහුණ දීමට ජනතාව විශේෂයෙන් තරුණ පෙළ යොමු කිරීමටත්, ලබා ගන්නා ලද අධ්‍යාපනය මගින් රටේ ආර්ථික හා සමාජමය දියුණුවට දායක වීමටත්, රටේ නිෂ්පාදන ක්‍රියාවලියට ඵලදායීව සහභාගිවීමටත් තරුණ පෙලට අවස්ථාවක් ලබාදීමටත් හැකිවේ.



රිචඩ් පතිරණ ඇමතිවරයා පාසැලක සිසුන්ගේ අවශ්‍යතා සොයා බලමින් .

ලෝකයේ ඉතා විශාල සාක්ෂරතාවක් ඇති ජපානය, එංගලන්තය වැනි රටවල ජනතාව භාවිතා කරන්නේ එකම භාෂාවකි. ඒ නිසා ඔවුන්ගේ සාක්ෂරතාවය ඉහළ මට්ටමක තිබිය හැක. එහෙත් ලංකාවේ වැඩිම ජනතාවක් සිංහල, ඉංග්‍රීසි හෝ දෙමළ භාෂාවන්ගෙන් අඩු වශයෙන් දෙකක්වත් සැලකිය යුතු ප්‍රමාණයකින් පාවිච්චි කරයි. මේ තත්ත්වය අනුව ශ්‍රී ලංකාවේ සාක්ෂරතාවය ලෝකයේ වෙනත් රටවලට වඩා ඉහළ මට්ටමක පවතී යයි පෙන්වා දිය හැක.

මේ හේතුව නිසා ශ්‍රී ලංකාවේ අධ්‍යාපන මට්ටම රටේ මානව හා ආර්ථික සම්පත් වර්ධනය කිරීම සඳහා හැඩ ගැස්වීම වත්මන් රජයට ඉතා පහසු කටයුත්තක් වනු ඇත.

එහෙත් පසුගිය රජය මෙම විශේෂිත සාක්ෂරතාවය කෙරෙහි ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා නැත. එසේම විද්‍යාව, ගණිතය ආදී අංශ මගින් නව තාක්ෂණයෙන් යුතු ආර්ථිකයක් කරා ගමන් කිරීමට ඉතා ප්‍රයෝජනවත් වන මෙම සාක්ෂරතාවය උපයෝගී කරගැනීම කෙරෙහි පසුගිය රජය දක්වා ඇති උනන්දුව ඉතාමත් කණගාටුදායකය.

එහෙයින් ජනාධිපතිතුමිය මෙම තත්ත්වය කෙරෙහි විශේෂ අවධානයක් යොමුකොට පසුගිය වසර දෙක තුළ අධ්‍යාපන ක්ෂේත්‍රයේ වැඩි දියුණුව කරා පියවර රාශියක් ගෙන තිබේ. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් මෙම පියවර දැනටමත් ක්‍රියාවට නංවා ඇත.

වත්මන් රජයේ අධ්‍යාපන ප්‍රතිපත්තිය මගින් ගුණාත්මක භාවයෙන් ඉහල මට්ටමකින්, යුත් අධ්‍යාපන පහසුකම් දිවයින පුරා වඩාත් සාධාරණ අන්දමින් පවත්වා ගෙන යාම සඳහා

(අ) විෂයමාලා හා ඉගැන්වීමේ ක්‍රම ප්‍රතිසංවිධානය කොට අධ්‍යාපනයේ අගය උසස් කිරීම.

(ආ) ගුරු වෘත්තියට නිසි ගෞරවයක් ලබාදීම, වෘත්තියට අදාල චර්යාවන් අනුගත කිරීම.

(ඇ) රටේ කාර්මික ප්‍රතිපත්තියට අදාලව වෘත්තීය පුහුණු ක්‍රම ඇති කොට රටේ රැකී රක්ෂා පිළිබඳ අවශ්‍යතාවයන්ට ගැලපෙන ලෙස ඒ ක්‍රමය වැඩි දියුණු කිරීම.

(ඉ) අවශ්‍ය ප්‍රති සංවිධානයන් සිදුකොට රටේ කර්මාන්තවලට අදාල රැකියා සඳහා අවශ්‍ය දස්කම් ප්‍රගුණ කරන්නාවූත්, උසස් මට්ටමේ පර්යේෂණ කටයුතු හා වෘත්තීය විශේෂඥතා පෝෂණය කරන්නාවූත් ක්‍රමයක් බවට අධ්‍යාපනය පත් කිරීම.



පාසැලක දරු දැරියෝ

පසුගිය වසර දෙක තුළ මේ අපේක්ෂාවන් ඉටු කර ගැනීම සඳහා අතිශයින් වැදගත් මූලාරම්භයන් ගණනාවක් හඳුන්වා දී ඇත.

## ගුරු පුබුදුව

රාජ්‍ය සේවකයින් අතර, ඉතා පහත් ගණයේ සේවකයින් කොටසක් ලෙස ශ්‍රී ලංකාවේ ගුරුවරුන් දිවයිනට නිදහස ලැබීමෙන් පසුව හා පෙර සලකන ලදී. එහෙත් එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා මෙම තත්ත්වය වෙනස් කොට ඔවුන් ගෞරවනීය රාජ්‍ය නිලධාරීන් කොටසක් වශයෙන් පිළිගත්තේය. ඔවුන් රාජ්‍ය නිලධාරීන් කොටසක් පමණක් නොව රාජ්‍ය නිලධාරීන් පුහුණු කරන අති ගෞරවනීය විද්‍යාර්ථීන් කොටසක් ලෙස එතුමා සැලකුවේය.

එහෙත් ඉංග්‍රීසි භාෂාවට මුල්තැන දුන් පසුගිය වසර 17 ක් තුළ ඔවුන් නොසලකා හැර තිබුණි.

මෙහිදී වර්තමාන ජනාධිපතිතුමිය මානව හිමිකම් කෙරෙහි දක්වන අතිශය සුවිශේෂ උනන්දුව සමස්ත මානව සංහතිය කෙරෙහි එකසේ විහිද යයි.

ඒ අනුව ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ක්ෂේත්‍රයෙහි අභිමානය, ගෞරවය, ස්වාධීපත්‍යය, වටිනාකම, වෘත්තීය වටිනාකම සලකා 1994 ඔක්තෝබර් මස ශ්‍රී ලංකා ගුරු සේවය පිහිටුවන ලදී. මේ සේවය ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා අධ්‍යාපනයට වෙන් කොට තිබූ මුල් ප්‍රතිපාදනයනට වඩා රු. මි. 2800 ක් වැය කොට ඇත. පිරිවෙන් හා පෞද්ගලික පාසල් ගුරුවරුන් ගුරු සේවයට ඇතුලත් කොට ඔවුන් උසස් වැටුප් ක්‍රමයෙහි පිහිටුවීම සඳහා අමතරව රුපියල් මිලියන 75 ක් 1996 වසරේ දී වෙන් කිරීමට දැනටමත් කටයුතු යොදා තිබේ.

මේ හැර විදුහල්පති ශ්‍රේණීන් සඳහා වූ විෂමතාවයන් මඟ හැරවීමට 1996 වසරේ දී කටයුතු යොදා ඇත. විදුහල්පතිවරුන්ගේ ශුභ සාධනය සඳහා ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ව්‍යවස්ථා කෙටුම්පත සකස් කිරීම දැනටමත් නිම කොට ඇත.

පසුගිය රජය යටතේ ගුරුවරුන්ට සිදුවූ දේශපාලන පලිගැනීම් පිළිබඳ කමිටු දෙකක් සඳහා ලැබී ඇති පැමිණිලි 25,000 ක් පමණ පිළිබඳව මේ වන විට කටයුතු කරගෙන යනු ලැබේ.

දිස්ත්‍රික් මට්ටමින් අතිරේක අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් පත් කිරීමෙන් හා ප්‍රාදේශීය මට්ටමින් සම්බන්ධීකරණයක් ඇති කිරීමෙන් මනා කළමනාකාරිත්වයක් යටතේ ප්‍රාදේශීය අධ්‍යාපන ක්‍රමය ප්‍රතිව්‍යුහගත කිරීම 1995 වසර නිමවීමට පෙර අවසන් විය. මෙම ප්‍රතිසංවිධානයන් මගින් ජාතික පාසල්, ගුරු පුහුණු විද්‍යාල සහ පිරිවෙන් පිළිබඳ අධීක්ෂණ කටයුතු මධ්‍යම රජයට පැවරෙන අතර, ප්‍රාදේශීය අධ්‍යාපන ආයතන පිළිබඳ අධීක්ෂණ කටයුතු අදාල පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත පැවරේ.

ජාත්‍යන්තර සංවර්ධන රටාවනට සාර්ථකව මුහුණ දීම පිණිස ඉංග්‍රීසි භාෂාව පිළිබඳව මනා පරිචයක් අප සිසුනට ද ලබා දීමට ගත වූ වසර දෙක තුළ දී පියවර රැසක් ගෙන තිබේ. 1994 ඉංග්‍රීසි ගුරු පුහුණුව සඳහා ඇතුළත් කළ ගුරුවරුන් 3013 ක සංඛ්‍යාව 1995 දී 3427 දක්වා වැඩිකර ඇත්තේ මේ පියවර යටතේය. ලෝක බැංකුවේ ආසියානු සංවර්ධන බැංකුවේ සහ බ්‍රිතාන්‍ය විදේශ සංවර්ධන ආයතනයේ ආධාරයෙන් 1996 වසරේ දී මෙම පුහුණු වැඩ සටහන තව තවත් පුළුල් කිරීමට කටයුතු යොදා ඇත.



මිහින්තලය විශ්ව විද්‍යාලය විවෘතවීම

## ජාතික පාසල්

අධ්‍යාපන පහසුකම් දිවයිනේ සෑම ප්‍රදේශයකම එක හා සමාන ලෙස සැලසීමේ අරමුණින් රට පුරා විද්‍යාල ගණනාවක් ජාතික පාසල් වශයෙන් නම් කිරීමටත්, ඒවාට අවශ්‍ය පහසුකම් මේ වසරේදීම තව දුරටත් පුළුල් කිරීමටත් කටයුතු යොදා ඇත. 1994 වසරේ මෙම පාසැල් සංඛ්‍යාව 158 ක් වූ අතර, 1995 සැප්තැම්බර් වන විට මෙය පාසල් 195 දක්වා වැඩි විය. 1996 වන විට සංඛ්‍යාව ජාතික පාසල් 225 ක් පමණ වනු ඇත. මේ හැර අතිරේක ගුරුවරුන් රැසක් බඳවා ගැනීමට දැනටමත් කටයුතු යොදා ඇත.

ගුරුවරුන් පුහුණු කිරීම සඳහා නව රජයේ විශේෂ අවධානයක් යොමු වී ඇත. මඩකලපුවේ නව ගුරු අධ්‍යාපන පීඨයක් විවෘත කොට ඇත.. 1995 වසරේ දී ගුරු පුහුණුව සඳහා බඳවා ගන්නා ලද 1939 ක් වූ සිසුන් සංඛ්‍යාව 1994 වසරේ දී බඳවා ගන්නා ලද සිසුන් සංඛ්‍යාවට වඩා 436 ක වැඩිවීමකි. එසේම ගුරු පුහුණුව සඳහා 1995 දී ගත් සිසුන් සංඛ්‍යාව 1956 කි. 1996 වසරේ දී බඳවා ගන්නා ලද සිසුන් සංඛ්‍යාව 866 කින් වැඩිවීමකි. මෙය ඉදිරියේ දී තවත් වැඩි කරනු ඇත. ගුරු පුහුණු වැඩ සටහන් ක්‍රමානුගතව සම්බන්ධීකරණක් කිරීම පිණිස " ජාතික ගුරු පුහුණු අධිකාරියක් " පිහිටුවීමට ද පියවර ගෙන ඇත.

අධ්‍යාපන විෂයමාලා හා ඉගැන්වීමේ ක්‍රම ප්‍රතිශෝධනය කොට එහි ගුණාත්මක අගය උසස් කිරීමේ අරමුණින් ජාතික උසස් අධ්‍යාපන ආයතනය පසුගිය වසර තුළදී ව්‍යාපෘති ගණනාවක් අරඹා ඇත. අම්පාර, රත්නපුර හා අනුරාධපුරය විශ්ව විද්‍යාල ආයතන පිහිටුවීම මෙම අරමුණෙහි ප්‍රධාන ප්‍රතිඵලයකි. උසස් අධ්‍යාපනය සඳහා ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීම හා අධ්‍යාපන පහසුකම් අඩු ප්‍රදේශයන්හි ශිෂ්‍යයින් සඳහා විශ්ව විද්‍යාලයන් තුනක් පිහිටුවීමේ කටයුතු 1995 වසරේ දී ඇරඹිණි. මෙයින් මුල් විශ්ව විද්‍යාලය අම්පාර දිස්ත්‍රික්කයේ විවෘත කෙරුණු අතර, අනෙක් විශ්ව විද්‍යාල දෙක අනුරාධපුර සහ රත්නපුර දිස්ත්‍රික්කයේ

1996 වන මේ වසරේ දී විවෘත කොට ඇත. පසුගිය වසරේ දී විශ්වවිද්‍යාලයන්හි නේවාසික පහසුකම් ලබන සිසුන් සංඛ්‍යාව 37% කි. 1996 වන විට මෙය 50% තෙක් වැඩි කිරීමේ අරමුණින් රජය විසින් රු.කෝටි 50 ක මුදලක් මේ සඳහා වෙන් කරනු ලැබ ඇත.

## කම්කරු හා වෘත්තීය පුහුණුව

සාම්ප්‍රදායික විෂය මාලා ඉගැන්වීමේ ක්‍රමය ඉවත් කොට ඒ ඒ ප්‍රදේශයනට ආවේණික වෘත්තීය පුහුණු පාඨමාලා මෙම විශ්වවිද්‍යාලයන් මගින් ඉගැන්වෙනු ඇත. 1995 හා 1996 වසරේ දී පිහිටවූ මෙම විශ්වවිද්‍යාලයන් තුන මගින් මෙතෙක් අනෙකුත් විශ්වවිද්‍යාලයන් මගින් අධ්‍යාපනය ලබාදුන් සාම්ප්‍රදායික විෂය මාලාවන් සම්පූර්ණයෙන් වෙනස් කොට ඒ ඒ ප්‍රදේශයන්හි සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබාගත හැකි පාඨමාලාවන් සඳහා ප්‍රමුඛත්වයක් දී ඇත. උදාහරණයක් වශයෙන් මැණික් කර්මාන්තය, භූගර්භ විද්‍යාව වැනි විෂයයන් සඳහා සබරගමුව විශ්වවිද්‍යාලය ප්‍රමුඛත්වය දී තිබේ. රජයේ වත්මන් ආර්ථික හා සමාජ අවශ්‍යතාවයනට ගැලපෙන අයුරින් මෙය සිදු කෙරේ.



කම්කරු හා වෘත්තීය පුහුණු අධිකාරිය පිහිටුවීම

විශ්වවිද්‍යාලයන් සඳහා දැනට ඇතුළු කර ගන්නා සිසුන් ගණන මේ වසරේ සිට 7000 කින් පමණ වැඩි කිරීමට තීරණය කොට ඇත. සියළුම සිසුන්හට වර්තමාන ලෝකයේ තාක්ෂණික දියුණුවට ගැලපෙන පරිදි පරිගණක හා ඉංග්‍රීසි පුහුණුව ලබා දීමටත්, උසස් අධ්‍යාපනය රටේ අධ්‍යාපනයට ගැලපෙන පරිදි ප්‍රතිශෝධනය කිරීමටත්, කටයුතු යොදා තිබේ.

මේ හැර නව තාක්ෂණයට මුහුණ දීම සඳහා ග්‍රාමීය ප්‍රදේශයන්හි දරුවනට පරිගණක තාක්ෂණය හඳුන්වාදීමේ අදහසින් විදුහල් 700 ක පමණ පරිගණක පුහුණුව ආරම්භ කෙරේ. දැනටමත් මධ්‍යස්ථානයන් 30 ක් විවෘත කර ඇති අතර, එම සංඛ්‍යාව මෙම වසර තුළ දී තවදුරටත් පුළුල් කෙරේ.

සෑම විෂය ක්ෂේත්‍රයකටම ගැලපෙන පරිදි 5 වසරේ ශිෂ්‍යත්ව විභාගය නැවත සංශෝධනය කිරීමට කටයුතු යොදා ඇත. මෙය 1994 සිට ක්‍රියාත්මක වේ. 1995 වසරේ දී සිසුන් 10,000 දෙනෙකුටම 5 වසරේ ශිෂ්‍යත්ව ප්‍රදානය කෙරිණ. මෙය 1996 දී 15,000 දක්වා ඉහළ නැංවේ.

දිවයිනේ අධ්‍යාපන ක්ෂේත්‍රයට ඇතුළු වන්නන්ගෙන් උසස් අධ්‍යාපනය සඳහා වරම් ලබන්නේ 2% කට අඩු ප්‍රමාණයකි. ඉතිරි සියට 98 විවිධ හේතූන් නිසා තම අධ්‍යාපනය නතර කරයි. මෙය ඉතා බරපතල ප්‍රශ්නයක් වන්නේ ශ්‍රී ලංකාවේ තරුණයින් අසහනයට පත්වීමට එය ද හේතුවක් වීම ය. අසහනය කැරලිවලට පෙළඹවීමට ද හේතුවක් විය. ක්‍රමවත් සමාජ සංවර්ධනයක් සඳහා මේ පිරිසගෙන් ලබා ගත හැකි දායකත්වය අතිමහත්ය. මේ පිළිබඳව ඉතා බරපතල ලෙස අවධානය යොමු කළ නව රජය කම්කරු හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ කාර්මික හා වෘත්තීය පුහුණුවක් ඔවුනට ලබා දීමටත්, ඔවුන් එමගින් රජයේ, පෞද්ගලික අංශයේ හෝ ස්වයං රැකියා අංශයේ රටේ ආර්ථික ක්‍රියාවලියක යෙදවීමටත් ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ආධාරයන් ලබා දීමටත්, පසුගිය වසර

දෙක තුළ දී කටයුතු යොදා ඇත. මෙම තත්ත්වය අරමුණු කොටගෙන 1995 අගෝස්තු මස ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය ස්ථාපනය කරන ලදී. 336 ක් වූ ජංගම පුහුණු මධ්‍යස්ථාන සහිත මිනිස්බල අංශය, නාරාහේන්පිට වැඩ මූලිකයන් පුහුණු ආයතනය, ඔරුගොඩවත්ත ස්වයංබල පුහුණු මධ්‍යස්ථානය යන ආයතනයන් මෙම අධිකාරිය යටතට පත් කොට මෙම වසර තුළ දී එම මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම ආරම්භ කොට ඇත.

කම්කරු දෙපාර්තමේන්තුව යටතේ පැවති ජංගම පුහුණු මධ්‍යස්ථාන, කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ තිබූ කාර්මික විද්‍යාලයන් හා අනුබද්ධ කාර්මික ඒකක සංඛ්‍යාව හා මාතලේ සහ දෙහිඅත්තකන්ඩිය අනුබද්ධ කාර්මික විද්‍යාලයත් වැඩි දියුණු කිරීම මෙම වසරේ දී සිදු කෙරේ.

පසුගිය වසරේ විදේශීය රැකියා කාර්යාංශය මගින් විදේශීය රැකියාවන්ට යන අයගේ සුභ සාධනය පිණිස ව්‍යාපෘති ගණනාවක්ම ක්‍රියාත්මක කොට ඇත. මෙලෙස විදේශගත වන්නන් සඳහා නොමිලයේ පුහුණු පාඨමාලා පැවැත්වීම මේ අතරින් ප්‍රධාන තැනක් ගනී. දැනට මෙවැනි මධ්‍යස්ථානයන් 11 ක් දිවයින තුළ පිහිටුවා ඇති අතර, මෙය 24 දක්වා වැඩි කිරීමට යුහුසුළුව කටයුතු කරගෙන යයි.

### සෞඛ්‍ය

දිවයිනේ සියළුම ජන කොටස් වෙනුවෙන් අංග සම්පූර්ණ සෞඛ්‍ය සේවාවන් සැපයීම සමාජ සංවර්ධනය උදෙසා ඉටු කළයුතු අත්‍යාවශ්‍ය කාර්යභාරයක් බව රජය පිළිගෙන ඇත. ඒ සඳහා අතිමහත් ව්‍යායාමයක් පසුගිය වසර දෙක තුළ එනම් මෙම රජය බලයට පත් වූ වසර දෙක තුළ දරා ඇත.

(අ) සෞඛ්‍ය සේවා අංශයෙහි සිදුවෙමින් තිබෙන මූලධන ආයෝජනය පිරිහීම වැලැක්වීමට පියවර ගැනීම.

(ආ) රෝග නිවාරණ කටයුතු වලටත්, ප්‍රාථමික මට්ටමේ සෞඛ්‍ය පහසුකම් සැපයීමටත්, වැඩි අවධානයක් දෙමින් සෞඛ්‍ය සේවා ක්ෂේත්‍රයේ මුදල් යෙදවීමේ ප්‍රමුඛත්වය පිළිබඳ වෙනස්කම් සිදුකිරීම මැලේරියා මර්ධන වැඩ සටහන වැඩි ප්‍රමුඛත්වයක් ඇතිව ක්‍රියාත්මක කිරීම.

(ඇ) සෞඛ්‍ය අංශයේ අරමුදල් සැපයීම වැඩි කොට වඩාත් දිළිඳු ජන කණ්ඩායම් වලට හා ග්‍රාමීය ප්‍රදේශ වලට ප්‍රමාණවත් තරමින් සෞඛ්‍යාරක්ෂක සේවාවන් ලැබීම සහතික වන ආකාරයට ඒ අරමුදල් වඩාත් හොඳින් යොමු කිරීම හා සෞඛ්‍ය අංශයේ සේවකයින්ගේ අභිවෘද්ධිය සඳහා ද අවශ්‍ය ඉඩ ප්‍රස්ථා සැලසීම

(ඈ) දිළිඳු දරුවන් ඉලක්ක කොටගත් සුභ සාධන වැඩ සටහන් ක්‍රියාත්මක කොට ඔවුන් අතර පවත්නා බරපතල අන්දමේ මන්දපෝෂණය පිටු දැකීම සඳහා විශේෂ ක්‍රියාමාර්ග අනුගමනය කිරීම.

1995 වසරේ දී රුපියල් කෝටි 12119.1 ක් සෞඛ්‍ය සේවාවන් සඳහා වෙන් කෙට ඇති අතර, එම මුදල රජයේ මුළු අයවැයෙන් 5.8% කි.. 1994 වෙන් කරන ලද මුදල රුපියල් කෝටි 4,696 ක් හෙවත්, එම අයවැයෙන් 4.3% කි.. මේ අනුව 1994 ට වඩා 1995 සෞඛ්‍ය සේවා වියදම වැඩිවීම 40% කි. මෙය 1996 වසරේ දී සියයට 46 දක්වා වැඩි වනු ඇත.

1994, 1995 හා 1996 වර්ෂවල සෞඛ්‍ය සේවා කළමනාකරණය, සංවර්ධනය හා සැලසුම්කරණය

මගින් මානව සම්පත් සංවර්ධන පිළිබඳ ප්‍රගති සමාලෝචන දස අවුරුදු සැලැස්මක් සකස් කෙරුණු අතර, සෞඛ්‍ය සේවා විමධ්‍යගත කිරීමේ හා ප්‍රගතිය ඇගැයීමේ අධ්‍යයනයක් සිදු කොට ඇත.

1994 වර්ෂයේ වෛද්‍ය නිලධාරීන් 311 දෙනෙකු සේවයට බඳවාගෙන ඇති අතර, 1995 වසරේ දී 886 දෙනෙකු බඳවා ගෙන ඇත. මීට අමතරව සෞඛ්‍ය අංශයේ විවිධ ශ්‍රේණීන් සඳහා 2449 කට පත්වීම් ලබා දී තිබේ.


පසුගිය වසර තුළ දිසා රෝහල් හතරක් මූලික රෝහල් ලෙස උසස් කොට ඇති අතර, පර්යන්ත ඒකක 12 ක් දිසා රෝහල් වශයෙන් උසස් කොට ඇත.

රෝග මර්ධන වැඩ පිළිවෙලක් මගින් පෝලියෝ රෝගය ලංකාවෙන් තුරන් වීමට වෛද්‍ය ආධාර ලබාදීම සහ කුඩා දරුවන් අතර මන්දපෝෂණය මැඩ පැවැත්වීම සඳහා ත්‍රිපෝෂ බෙදා හැරීමේ, මාතෘ සායන පැවැත්වීම උදෙසා සමාජ සේවා සංවිධාන සහ වතු මගින් හරහා රු. කෝටි 1.80 ක් වැය කොට ඇත.

# ආර්ථික සංවර්ධනයට විදේශ ආධාර

ශ්‍රී ලංකා ජනාධිපතිතුමියගේ චීන සංචාරය, චීනය හා ලංකාව අතර සබඳතාවයන්හි ශ්‍රී ලංකාව ලත් විශාල ජයග්‍රහණයකි. ජනාධිපතිතුමිය එම රට සමඟ පැවැත් වූ ද්වි පාර්ශ්වික සාකච්ඡා මගින් විශාල ආයෝජනයන් එනම් ඩොලර් බිලියන එකක ලබා ගැනීමට සමත් වූවා ය. මෙය 1990 - 1994 දක්වා චීනයෙන් ලංකාවට ලබාදුන් ආධාරයන්ගේ මුළු එකතුවට සමාන වේ.

මිත්‍රත්වය මෙන් ම ආධාරය ද්විපාර්ෂවිකව ශ්‍රී ලංකාවට නොපැකිලිව ලබාදෙන බවට ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය සමඟ සාකච්ඡාවේදී ද චීන ජනාධිපතිතුමන් එකඟ වී ඇත. '1956 දී එස්.ඩබ්.ආර්.ඩී බණ්ඩාරනායක මහතා සමඟ අප ඇතිකර ගත් මිත්‍රත්වය කිසිදාක අමතක නොකරන්නෙමු' යැයි චීන ජනාධිපතිතුමන් අතීතය අනුස්මරණය කරමින් පවසා ඇත. බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව ශ්‍රී ලංකාවට ප්‍රදානය කළේ මෙම මිත්‍රත්වය තහවුරු කිරීමටය.



ජනාධිපතිනිය චීනයේ දී උත්තමාචාර පිළිගනිමින්

චීනය, ශ්‍රී ලංකාවේ උපකාරකයෙකු වශයෙන් පසුගිය දශක තුනේදීම කටයුතු කළ නමුත් මේ වසරේ රුපියල් මිලියන 71 ක් ලබාදීම චීනයෙන් අප රටට ලැබී ඇති විශාලතම ආධාරයයි. මෙම මුදලින් වැඩි ප්‍රමාණයක් විනාශ වූ මහබැංකුව ප්‍රතිසංස්කරණය සඳහා වේ.

චීන රජයේ ආයෝජකයන් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමට ජනාධිපතිනිය එම රටේ ආයෝජකයන් සමඟ කළ සාකච්ඡා බෙහෙවින්ම ඵලදායක වූයේය. ඔවුන් බොහෝ දෙනෙකු ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීමට කැමැත්ත දැක්වූ අතර, දැනටමත් ආයෝජන මණ්ඩලය මගින් චීන ආයෝජකයන් 71 දෙනෙකුට මේ සඳහා අනුමැතිය දී ඇත. ස්වර්ණාභරණ සෑදීම, ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීම, බයිසිකල් සෑදීම , ඉස්සන් නිෂ්පාදනය, සිමෙන්ති හා රබර් නිෂ්පාදනය ඔවුන් ඇරඹීමට අපේක්ෂා කරන ව්‍යාපාරයන් ය.

මේ අතර, චීන ආයෝජකයෝ තේ සහ කුළුබඩු මෙන්ම කජු නිෂ්පාදනයට ද, කැමැත්තක් දක්වති. ඊට අමතරව ජනමාධ්‍ය උපකරණ නිෂ්පාදනය ගැන ද ඔවුන් උනන්දුවන බව ජනාධිපතිනියට දන්වා ඇත.

## ජපානයෙන් තවත් ආධාර

අතිගරු ජනාධිපතිනියගේ ජපාන සංචාරයේ මූලික අරමුණ ජපානයේ ව්‍යවසායකයන්ගේ ප්‍රතිචාරය ලබාගැනීමයි. මෙහිදී ජනාධිපතිනිය ජපානයේ අගමැතිවරයාට දන්වා සිටියේ ලංකාවේ යුද්ධයක් තිබුනත් 1995 දී 5% ක සංවර්ධන වේගයක් ලංකාවේ තිබූ බවත්, යුද්ධය අවසන් වූවිට මෙය 7-8% ට දක්වා වර්ධනය කර ගැනීමට තමා බලාපොරොත්තු වන බවත්ය. රජයේ අභිලාෂය සංවර්ධන වේගය

ක්‍රි..ව. 2000 දී 30% දක්වා නැංවීමයි. එය තුන් ගුණයක වැඩිවීමකි. මෙය කළ හැක්කේ අපේ ආර්ථික සංවර්ධනය 7-8 දක්වා නැංවීමෙනි. මෙම තත්ත්වය කරා ලඟාවීමට විදේශාධාර අවශ්‍ය වේ.

සත්‍ය වශයෙන්ම මෙහිදී ජපන් රජයෙන් සහ එහි ව්‍යවසායකයන්ගෙන් ලැබුන ප්‍රතිචාරය අතිශයින් සතුටුදායක විය. ජපන් ව්‍යාපාරිකයන් මේ රටේ පවත්නා යුද්ධයට බියක් නැත. ඔවුන් අපේ රටේ ආයෝජනය කිරීමට කිසිම පැකිලීමක් ද නැත. ශ්‍රී ලංකාව ලෝකයේ පෞද්ගලික ව්‍යාපාරිකයන්ට ඉතාමත් පහසුකම් සපයන රටක් බව ජපන් ව්‍යාපාරිකයන්ගේ මතයයි. ලෝක බැංකුවේ මතය කෙතෙක් අවාසනාවන්ත සිද්ධීන්ට මුහුණ පැවත් ශ්‍රී ලංකාව ලෝකයේ දියුණුව කරා යන දකුණු ආසියාවේ පුදුමාකාර රටක් බව ය.

උගත්, ඉතා හොඳින් වැඩ කරන යහපත්, තීක්ෂණ දැනුමක් ඇති ඉංග්‍රීසි භාවිතය තිබෙන රටක් වශයෙන් සහ ඉතා සාධාරණ නීති පද්ධතියක් හා උසස් සංස්කෘතියක් තිබෙන සහ මහජනතාවට ඉතා විනීතව සලකන ජනතාවක් ලෙස ලෝක බැංකුව ශ්‍රී ලංකාව හඳුන්වයි.

ශ්‍රී ලංකාව ලෝකයේ ඉතා හොඳ කෘෂිකාර්මික රටාවක් ඇති ඉතාම හොඳ වරාය පහසුකම් තිබෙන රටක් ලෙස ද ලෝක බැංකුව හඳුන්වයි.

අතිගරු ජනාධිපතිතුමියත් අනෙකුත් ඇමතිවරුනුත් තම රටේ ගෞරවය රැකෙන පරිදි ඉදිරිපත් කළ කරුණු මත ගෙන ඇති මෙම විශාල ආධාර ප්‍රමාණයත් ශ්‍රී ලංකාවේ සමෘද්ධිය අරභයා යොදා ගැනීම ඉතා වැදගත් වෙයි. මෙම ආධාර පසුගිය වසර දෙක තුළ අප යොදාගත් අයුරු මෙහිදී විමසා බැලීම වැදගත් වේ.

මූලික වශයෙන් මෙම ආධාරවලින් වැඩි ප්‍රමාණයක් ත්‍රස්තවාදී යුද්ධය නිසා විනාශයට පත් යාපනය අර්ධද්වීපයේ පුනරුත්ථාපන කටයුතු වලටත්, එම යුද්ධය නිසා අනාථ තත්ත්වයට පත් වූවන් වෙනුවෙනුත් යොදාගෙන ඇත. අනාථභාවයට පත් යාපනය අර්ධද්වීපයේ ජනගහණය සඳහා ආහාර සහ වෙනත් අත්‍යාවශ්‍ය දෑ සැපයීමට මෙම ආධාර වලින් විශාල ප්‍රමාණයක් යොදවනු ලැබීය. " ඉන්දියා ටුඩේ " සඟරාව 'ටැමිල් ටයිම්ස්' පුවත්පත, 'රොයිටර්' වාර්තා, "ද ඔස්ට්‍රේලියන්", 'චිකාගෝ ටයිම්ස්', ද හින්දු, ද ෆයර්තියර් , ද ස්ටේට්මන්ස්, නැෂනල් හැරල්ඩ් ඉන්ඩියා, සහ වෙනත් ජාත්‍යන්තර සහ දේශීය පුවත්පත්හි පලවූ වාර්තා කියවීමෙන් මෙම තත්ත්වය යථාර්ථවාදීව වටහාගත හැකිය.

1996 ජුනි 24 වන දින " ද අයිලන්ඩ් " පුවත්පත පවසන පරිදි රුපියල් කෝටි පනහක වියදමක් යාපන අර්ධද්වීපයේ ජනතාව නැවත පදිංචි කරවීම සඳහා යොදා ඇත. ශ්‍රී ලංකාවේ මුදල් ආයෝජනය කිරීම පිළිබඳව නිරීක්ෂණය කිරීම පිණිස චීනය, හොංකොං, මලයාසියාව, ඇමරිකාව, යුරෝපය සහ සිංගප්පූරුව, වැනි රටවල වෙළඳ නියෝජිත පිරිස් මේ රටට ගෙන්වා ගැනීමට විදේශ කටයුතු ඇමති ලක්ෂ්මන් කදිරගාමර් මහතා ඒ රටවල පසුගිය වසරේ කළ සංචාරයන්ගෙන් ලබාගත් ප්‍රතිලාභයන් තව තවත් ශක්තිමත් කිරීමට ජනාධිපතිතුමියගේ සංචාරයෙන් මහත් පිටුබලයක් ලැබුණු බව පරම සත්‍යයකි.

අවුරුදු 17 ක් තුළ ශ්‍රී ලංකාව ඉතා අවාසනාවන්ත තත්ත්වයකට පත්කළ එක්සත් ජාතික පක්ෂ රජය විසින් විනාශ කරන ලද ජන ජීවිතය නැවත සමෘද්ධිය කරා ගෙනයාමට ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 62% ක ජනගහනයට උවමනා වී ඇත. මෙයට උරදී ඇත්තේ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිනියගේ රජයයි. සම්පූර්ණයෙන්ම හිස්ව තිබූ එම 17 අවුරුදු ආණ්ඩුවේ භාණ්ඩාගාරයට මුදල් ආපසු සොයා ගැනීමට ඇයට සිදුවිය. ඇය ඉතාමත් සාර්ථක ලෙස එය ඉටුකළාය. ඇය පමණක් නොව ඇයගේ අමාත්‍යවරු ද මෙයට සහභාගි වූහ.

පසුගිය අවුරුදු දෙකක කාලය තුළ වත්මන් රජය විසින් මේ සඳහා දරන ලද උත්සාහය විශ්මය ජනකය. පසුගිය අවුරුදු දෙකක කාලය තුළ මෙරටේ දුර්වලව තිබූ ආර්ථික ව්‍යුහය ශක්තිමත් කිරීම සඳහා ආයෝජන කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමට රජය විසින් ගන්නා ලද පියවර අතිශයින් ප්‍රශංසනීයය. පෞද්ගලික ආයෝජකයන්ගේ විශ්වාසය ගොඩනගා ගැනීමට සහ එමගින් එම ප්‍රතිඵල මහජනතාව වෙත ලඟාවීම සහතික වන සේ කටයුතු කිරීමට රජය ක්‍රියා කරයි.

වත්මන් රජය බලයට පත් වී ගත වූ අවුරුදු දෙකක කාලයක් තුළ එක් අතකින් දැවැන්ත යුද්ධමය ක්‍රියාකාරිත්වයක යෙදෙන අතර, මූල්‍ය අර්බුදයකට මුහුණ දෙමින් ආර්ථික අංශයේ සැහෙන දියුණුවක් ලබා ගැනීමට ද රජය සමත්වී ඇත.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# කෘෂිකර්මාන්තය, ධීවර හා සත්ව නිෂ්පාදනය

කෘෂිකර්මාන්තය ශ්‍රී ලාංකිකයින් වැඩි දෙනෙකුගේ අදත් ප්‍රධාන ජීවන වෘත්තියයි. පසුගිය කාලයේ දී ගොවියාගේ ජීවන පැවැත්ම කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු නොවිය. එනිසා වත්මන් රජය කෘෂිකර්ම අංශයට කඩිනම් සහන ලබාදීම, එසේම ගොවීන්ගෙන් අයවිය යුතු බැංකු ණය අවලංගු කිරීම, ණය මුදල් ප්‍රදානය කිරීම, පොහොර සහනාධාරය යළි ස්ථාපිත කිරීම සහ වී මිළදී ගැනීමේ මණ්ඩලය නැවත ප්‍රතිසංවිධානය කිරීම වැනි ක්ෂණික පියවරවල් පසුගිය වසර දෙක තුළ දී ගන්නා ලදී. දිගුකාලීන පියවර අතර රජය විසින් හඳුන්වාදෙන ලද 'අමා' වැඩ සටහන වැදගත් විය. ගොවි සෙවන, ගොවිජන බැංකුව, ගොවිසෙත ලොතරැයිය මේ යටතේ ස්ථාපිත විය. කෘෂිකර්ම රක්ෂණ ක්‍රමය ප්‍රතිසංස්කරණය කළේය. ඒ යටතේ ගොවීනට ප්‍රසාද දීමනා වැඩි කළා පමණක් නොව ගොවියා ගෙන් පසුව ඔහුගේ භාර්යාවට ඒ ප්‍රතිලාභ ලැබීමේ ක්‍රමයක් ඇති කෙරුණි.



ගොවි සෙවන පිහිටුවීම

මේ සියළු පියවරවල ප්‍රතිඵල නම් වී නිෂ්පාදනය වැඩිවීමයි. වී අස්වැන්න 1993 මහ කන්නයේ දී මෙ.ටො. 2,570,170 ක් ද, 94 දී මෙ.ටො. 2,683,690 ක් ද, 1995 දී මෙ.ටො. 2,809,890 ක් ද, 1996 මුල් මාස කිහිපයේ දී මෙ.ටො. 1,914,450 ක් ද විය.

## වැව්ලි අංශය

වැව්ලි අංශය වැඩි දියුණු කිරීමට වත්මන් රජය විශාල පරිශ්‍රමයක් දරයි. පසුගිය රජය විසින් වැව්ලි අංශය හිතුවක්කාර ලෙස පෞද්ගලික අංශයට ඉතා අඩු මිළට පැවරීම නිසාත්, ඒවා ලබා ගත් වැව්ලිකරුවන් වැව්ලි වැඩි දියුණු කරනු වෙනුවට හැකිතාක් දුරට ඵලදාව නෙළා ගැනීමෙන් තමන්ගේ ලාභය වැඩිකර ගැනීමට කටයුතු කිරීම නිසාත් වැව්ලි අංශයේ දියුණුව බෙහෙවින් අඩාල විය. මේ තත්ත්වය මඟ හරවා වැව්ලි අංශයෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ වත්මන් රජය 1994 වර්ෂය තුළ ලාභ පෙන්වූ ප්‍රධාන වැව්ලි සමාගම් පාලනය කරන පාලක සමාගම් 10 ක් වතුවල කොටස් මිළදී ගැනීම සඳහා දැනට ලියා පදිංචි කර තිබේ. ප්‍රධාන වැව්ලි සමාගම් 23 කම කොටස් විකිණීම වත්මන් රජය නිම කරමින් සිටී.

මෙම වසරේ සිට ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි රාජ්‍ය වැව්ලි අංශයේ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ඇමරිකානු ඩොලර් මිලියන 600 ක ණය මුදලක් ලබා ගැනීම සඳහා කටයුතු අවසන් කොට ඇත.

## සමාජ යටිතල පහසුකම්

පවුල් 20,450 කට ප්‍රයෝජනවත් වන සේ ස්වයං උපකාර නිවාසයක් ද එම පවුල් සඳහා ප්‍රතිලාභ ගෙන දෙන ජල යෝජනා ක්‍රමයන් ද පසුගිය වසරේ සිට මේ වන තෙක් නිමකරනු ලැබ ඇති අතර, මෙම වසර

අවසන් වන විට රජයේ සේවකයන් සඳහා නිවාස යෝජනා ක්‍රම ගණනාවක් ද, සාමාන්‍ය මහජනතාවට අඩු වියදමින් ඉදි කරන නිවාස යෝජනාක්‍රම ගණනාවක් ද ඇරඹීම සඳහා කටයුතු සම්පූර්ණකොට තිබේ.

## තේ

හෙක්ටයාර් 2753ක් නැවත වගා කිරීම යටතේ ද, හෙක්ටර්යාර් 9827 ක් නව වගාකිරීම යටතේ ද වැඩිදියුණු කරනු ලැබීය. ක්ෂේත්‍ර කටයුතුවල සංවර්ධනය සඳහා රුපියල් ලක්ෂ 870 ක් ද, තවාන් සංවර්ධන කටයුතු සඳහා රුපියල් ලක්ෂ 120 ක් ද ණය වශයෙන් ප්‍රදානය කොට ඇත. තේ කම්හල් 36 ක් ඉදිකිරීම සඳහා රුපියල් දස කෝටි 7 ලක්ෂයක සහනාධාරයක් ද පවත්නා තේ කම්හල් නවීකරණය සඳහා රුපියල් එක්කෝටි 45 ලක්ෂයක් ද ආයෝජනය කර තිබේ. මේවායින් බොහොමයක් දෙවන ලෝක යුද්ධ සමයේ ඉදිකරන ලද ඉතා පැරණි තේ කම්හල් වේ. එහෙයින් ඒවා නවීකරණය කිරීම ඉතාමත් අත්‍යාවශ්‍ය කටයුත්තක් වී ඇත. තේ පැකට් කිරීමේ යන්ත්‍ර 43 ක් මිළදී ගැනීම සඳහා රුපියල් දෙකෝටි හැත්තෑ හතර ලක්ෂයක් ද තේ කම්හල් ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා රුපියල් 6 කෝටි අසූලක්ෂයක මුදලක් ද යොදවා ඇත. 1995 තේ නිෂ්පාදනය මෙතෙක් වාර්තාගත තේ නිෂ්පාදනය වන 1994 තේ නිෂ්පාදනයට ආසන්න වී ඇති අතර එය 1996 වසර තුළ දී තවදුරටත් වර්ධනය වනු ඇත.

## රබර්

නව වගා කටයුතු සඳහා ගෙවනු ලබන රබර් සහනාධාර 1995 ජනවාරි පටන් සියයට 50 කින් වැඩිකරනු ලැබීය. හෙක්ටර්යාර් 2031 ක් නැවත වගා කරන ලදී. 1995 මුල් භාගය තුල රබර් නිෂ්පාදනය සියයට 9.4 කින් වැඩිවිය. කුඩා රබර් වතු හිමියන්ගේ සමුපකාර සමිති 264 ක් පිහිටුවන ලදී. ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කයන්හි රබර් කිරි කපන්නන් 600 දෙනෙකුට අතිරේකව මෙම වසරේ දී තවත් 500 ක් දෙනා පුහුණු කරවනු ලැබූ අතර, මේ වසර තුළදී මෙම වැඩ සටහන තවදුරටත් ඉදිරියට ක්‍රියාත්මක කරනු ලැබේ.

## පොල්

හෙක්ටයාර් 1222 ක් නැවත වගාව සඳහා ද හෙක්ටයාර් 1030 ක් නව වගාව සඳහා ද යෙදවූ අතර, හෙක්ටයාර් 1207 අතුරු භෝග සඳහා ද යොදා ගන්නා ලදී. ගෙවතු වගා යටතේ හෙක්ටයාර් 9360 ක භෝග වගා කෙරිණි. පොල් මෝල් 15 ක් හා කොහු මෝල් 42 ක් සංවර්ධනය කිරීම සඳහා රුපියල් ලක්ෂ 63 ක මුදලක් ද සහනාධාර වශයෙන් සපයන ලදී. පසුගිය වසරේ පොල් නිෂ්පාදනය 8% ක වැඩිවීමක් පෙන්නුම් කළේය.

## ධීවර කර්මාන්තය

ජනවාර්ගික යුද්ධය නිසා විශේෂයෙන් උතුරේ ධීවර ජනතාවට පසුගිය අවුරුදු කීපය තුළ පීඩා විඳීමට සිදුවීම නිසා ධීවර අංශයේ තරමක් පසුබෑමක් විය. එහෙත් වත්මන් රජය මෙම තත්ත්වය මග හරවා ධීවර කර්මාන්තය නැංවීමටත්, ධීවර නිෂ්පාදනය නැංවීමටත්, ගතහැකි සෑම පියවරක්ම ගෙන ඇත. ධීවර අංශ සංවර්ධනයේ ප්‍රධාන ඉලක්කය වූයේ ධීවර කර්මාන්තයේ ආදායම් වැඩි දියුණු කිරීමත් ධීවර ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමත් ක්‍රමවත්ව ජාතික ආර්ථිකයට ධීවර කර්මාන්තයේ දායකත්වය වැඩි කිරීමත් වේ. මේ ඉලක්කය සපුරා ගැනීම සඳහා ධීවර අංශය නවීකරණය කිරීම, වෙළඳපොල පහසුකම් ඇති කිරීම සහ පෞද්ගලික අංශයේ සහභාගිත්වය ලබා ගැනීම යන උපාය මාර්ගයන් රජය විසින් යොදන ලදී.

කිරින්ද, පුරාණ වැල්ල, මිරිස්ස, බේරුවල, හලාවත යන ධීවර වරායන් රුපියල් කෝටි 110 කට අධික මුදලකින් ප්‍රතිසංස්කරණය කොට ඇති අතර,

ගැඹුරු මුහුදේ ධීවර කටයුතු කළහැකි වන පරිදි මෝදර ධීවර වරාය කිලෝ මීටර් 42 කින් දීර්ඝ කරන ලදී. මේ හැර කල්පිටිය, තංගල්ල, වැලිගම වැනි වරායයන් ගණනාවක නඩත්තු කටයුතු සඳහා රුපියල් ලක්ෂ 26 ක් ආයෝජනය කොට ඇත.

ධීවර බෝට්ටු එන්ජින් ආදිය සහනාධාර වශයෙන් ලබාදීමෙන් රුපියල් 9 කෝටි වියදම් කොට තිබේ. මට්ටක්කුලිය බෝට්ටු අංගනය නැවත විවෘතවිය. අනුරාධපුරයේ හා මඩකලපුවේ නව අයිස් යන්ත්‍රාගාර පිහිටුවනු ලැබීය. නව ධීවර කර්මාන්ත දිරිමත් කිරීම සඳහා ආයෝජකයින් 24,000 කට බලපත් නිකුත් කරන ලද අතර, එය මෙම වසරේදී තවදුරටත් ව්‍යාප්ත කෙරෙනු ඇත.

රජය විසින් ගනු ලැබූ තවත් වැදගත් පියවරක් වූයේ මිරිදිය මත්ස්‍ය කර්මාන්තය වැඩිදියුණු කිරීමයි. මේ කර්මාන්තය වැඩි දියුණු කිරීම සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය ලබා ගැනීමට රජය කටයුතු යොදා ඇත. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඉස්සන් වගා කිරීම, බෙල්ලන් වගා කිරීම, දියුණු කිරීම සඳහා පෞද්ගලික ආයෝජකයන් සහ කුඩා ආයෝජකයන් සඳහා සහන රැසක් වත්මන් රජය මේ වසර තුළදී ක්‍රියාත්මක කිරීම අරඹා ඇත. ඒ හැර දකුණු පළාත් සංවර්ධනය කිරීමේ යෝජනා ක්‍රමය යටතේ ධීවර වරායවල් ප්‍රතිසංස්කරණය කිරීම සහ ධීවර වරායට අවශ්‍ය වන යටිතල පහසුකම් සැපයීම මගින් දකුණු පළාතේ ධීවර ජනතාවට ඉමහත් සෙතක් ලහාකර දීමට රජය කටයුතු කරගෙන යයි.

## පශු සම්පත්

ග්‍රාමීය ගොවි ජනතාව අතර උසස් ගණයේ දෙනුන්, කුකුළු පැටවුන් බෝ කිරීම සඳහා ජනතා පශු සම්පත් මණ්ඩලය විශේෂ උත්සාහයක් දරා ඇත. මේ සඳහා කුකුළු පැටවුන් සඳහා සරිලන ඉල්ලුම සැපයීමට කෘතිම ජනක යන්ත්‍ර දෙකක් පිහිටුවා ඇත. පොදු සත්ව රෝග නිවාරණය සඳහා සතුන් විශාල සංඛ්‍යාවක් වෙත රෝග නිවාරණ කාරකයක් ලබා දී ඇත. උසස් ගනයේ ක්ෂීරපායී සතුන් සැපයීමේ රජයේ වැඩ පිළිවෙල යටතේ පෞද්ගලික අංශයේ සහභාගිත්වය උනන්දු කරවීමත් සිදු කෙරේ. මේ සතුන් බෝ කරන ස්ථාන සංඛ්‍යාව 46 දක්වා වැඩිවීම මෙහිලා ලබා ඇති ප්‍රගතියකි.

## කර්මාන්ත

වත්මන් රජය යටතේ කර්මාන්ත අංශය විශාල ප්‍රගතියක් ලබා ඇත. ජනවාර්ගික යුද්ධය සඳහා විශාල වියදමක් සිදුවන මේ අවස්ථාවේදී කර්මාන්ත අංශයෙන් ලද ප්‍රගතිය ප්‍රශංසනීය වේ. 1995 මුල් හයමස තුළ කර්මාන්ත නිෂ්පාදකයන්ගේ එකතුව 8% ක වර්ධනයක් දක්වයි. ඇඟළුම් කර්මාන්තය, සම්භාණ්ඩ නිෂ්පාදනය, ආහාර හා බීම වර්ග, දුම්කොළ, රසායන ද්‍රව්‍ය, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන අංශයෙහි මේ ප්‍රගතිය විශාල වශයෙන් දක්නා ලැබෙයි. 1994 වසරේ දෙවන කාර්තුවේදී 765,000 ක් වූ පතල් අංශයේ රැකියා ප්‍රමාණය 1995 වසරේ මුල් කාර්තුව තුල 920,000 දක්වා වර්ධනය වී ඇති අතර, එය 1996 මුල් කාර්තුව තුළ 1,025,000 ඉක්මවා ගොස් ඇත.

සීතාවක කර්මාන්ත ජනපදයට අමතරව ප්‍රාදේශීය කර්මාන්ත ජනපද 19 ක් පිහිටුවීමට දැනටමත් රජය සැලසුම් පිළියෙල කරගෙන යයි. කොළඹ හා ඒ අවට ප්‍රදේශයන්හි ඇති තදබදය මඟ හැරවීමටත්, දුර බැහැර ප්‍රදේශයන්හි කර්මාන්ත සංවර්ධනය වැඩි දියුණු කිරීමත් මින් අපේක්ෂිතය.

කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් පෞද්ගලික අංශයේ සහායෙන් හම්බන්තොට, මිරිජ්ජවිල හා මීරිගම කර්මාන්ත ජනපද දෙකක් පිහිටුවීමේ කටයුතු දැන් ආරඹා ඇත. 1995 වසර අවසන් වන විට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනුමත කළ ව්‍යාපෘති 155 න් 87 ක්

ක්‍රියාත්මක වී ඇති අතර, රුපියල් බිලියන 7.2 ක විදේශ ආයෝජන ඇතුළත් ව රුපියල් බිලියන 18.6 ක මුළු ආයෝජනයක් මෙහිලා අපේක්ෂිතය. මේ ව්‍යාපෘතිවල අපනයන ඉපැයුම රුපියල් බිලියන 18.6 ක මුළු ආයෝජනයක් මෙහිලා අපේක්ෂිත ය. මේ ව්‍යාපෘතිවල අපනයන ඉපැයුම රුපියල් බිලියන 61 කි. මෙම ව්‍යාපෘතිවල සෘජු රැකියා ප්‍රමාණය 23,198 කි.

මේ හැර 1996 වසරේ දී අතිගරු ජනාධිපතිතුමිය විසින් කරන ලද ජපන්, චීන හා කොරියන් සංචාරයන් හි දී අතිශයින් ප්‍රශංසනීය ලෙස එම රටවල ආයෝජකයින් මෙරටට ගෙන්වා ගැනීමට ගත් උත්සාහය නිසා විශාල වශයෙන් මෙම ආයෝකයින් නුදුරු අනාගතයේ දී ශ්‍රී ලංකාවේ ඔවුන්ගේ ව්‍යාපෘතීන් අරඹනු ඇත. මෙය ශ්‍රී ලංකාවේ විදේශ විනිමය හිඟය පියවා ගැනීමට ලැබුණු සමෘද්ධිමත් ධන නිධානයක් ලෙස සැලකිය හැක.

පංගු වලින් සම්පූර්ණයෙන් නිදහස් ඉතා තරඟකාරී ජපන් වෙළඳපලට ඇතුළුවීම සඳහා කටයුතු කිරීමට 1995 වසර තුළ දී ශ්‍රී ලංකාව සමත් විය. ඇඟළුම් අපනයනයේ දී පංගු රහිත අපනයන ප්‍රමාණය 40% සිට 50% දක්වා වැඩි කිරීමට හැකිවීම ඉතා වැදගත් ප්‍රගතියකි. ඇමරිකා එක්සත් ජනපදය සමඟ පැවැත් වූ රෙදිපිළි පිළිබඳ ද්විපාර්ශික ගිවිසුම් සාකච්ඡා නිසා එම රටේ රෙදිපිළි වෙළඳපලට පිවිසීමේ අවස්ථාව සැලකිය යුතු ප්‍රමාණයකින් වර්ධනය කර ගැනීමට ද ශ්‍රී ලංකාව සමත් විය.

ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වන රටකට ඉතා වැදගත් වෙයි. රටේ වැඩි පිරිසක් ධනවතුන් නොවන රටක මෙවැනි කර්මාන්ත ඇරඹීමට ඔවුනට ඇති ඉඩ ප්‍රස්ථාවන් වැඩි වන්නේ මෙවැනි කුඩා හා මධ්‍යපරිමාණයේ කර්මාන්තයන් සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වැය කිරීමට සිදුනොවීමත්, මෙවැනි කර්මාන්තයන් සඳහා වාණිජ බැංකු වලින් මුදල් ලබා ගැනීම එතරම් අපහසු නොවීමත් නිසාය. මෙම අරමුණෙන් සහ එමගින් පරිසමාප්ත සංවර්ධනයක් සඳහා රට යොමු කිරීමේ අභිලාෂයෙන් වත්මන් රජය පසුගිය වසර දෙක තුළ දී කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශය සඳහා ප්‍රමුඛත්වයක් දීමට වත්මන් රජය සැදී පැහැදී සිටී. මේ සඳහා 1995 වසරේ සිට රාජ්‍ය බැංකු දෙක මගින් මෙම යෝජනා ක්‍රමයට ආධාර සැපයීමටත් 1997 ජූලි මස දක්වා ලෝක බැංකු ණය ආධාර සපයා ගැනීමටත් 1998 ඔක්තෝබර් මස සිට ආසියානු සංවර්ධන බැංකුවෙන් ණය ආධාර ලබා ගැනීමටත්, හැකිවීම වත්මන් රජය පසුගිය වසර දෙක තුළ දී ලබාගත් ජයග්‍රහණයක් වෙයි. ඇමෙරිකානු ඩොලර් මිලියන 25 කින් යුත් කර්මාන්ත සංවර්ධන අරමුදල පිහිටුවීම මගින් සුළු හා මධ්‍ය කර්මාන්ත අංශයට සහායවීමේ වැඩපිළිවෙලක් සඳහා රජය මේ වන විට පියවර ගෙන ඇත. විද්‍යා තාක්ෂණ හා මානව සම්පත් සංවර්ධන අමාත්‍යාංශය සමඟ කර්මාන්ත සංවර්ධන මණ්ඩලය මේ අංශය වෙත තාක්ෂණික සහාය ලබාදීමට පියවර ගෙන තිබේ.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශයන් නඟා සිටුවීම

## නිවාස සංවර්ධනය

ශ්‍රී ලාංකිකයන්ගේ මූලික ජීවන අවශ්‍යතාවයක් වන නිවාස සහසුකම් අවම රටක් ලෙස ශ්‍රී ලංකාව හැඳින්විය හැක. ජීවිතයේ එක්වරක් පමණක් කෙරෙන විශාල ධන ආයෝජනයක් වන නිවාසයක් තැනීම ශ්‍රී ලංකාව වැනි 60% ක් පමණ වන දුගී ජනතාවක් සිටින රටක ජනතාවට එතරම් පහසු කටයුත්තක් නොවේ. එහෙයින් වත්මන් රජය නිවාස සංවර්ධන වැඩ පිළිවෙලවල් ගණනාවක් ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත. රජයෙන් සපයන මුදල් හා ද්‍රව්‍ය ආධාරයන්ගෙන් සහ ගම් ප්‍රදේශයෙන් ලබාගත හැකි සම්පත් මගින් ද තමන්ගේ නිවාස යෝජනා ක්‍රම සහ රජයේ සේවකයින් සඳහා ඉදිකෙරෙන නිවාස යෝජනා ක්‍රම ඒවින් සමහරකි. සෑම මැතිවරණ කොට්ඨාශයක ම නිවාස සියය බැගින් ලබාදීමේ වැඩපිළිවෙල, ග්‍රාමීය හා වතු නිවාස වැඩ පිළිවෙළ සහ ආපදා නිවාස වැඩ පිළිවෙල මේ අතර වේ. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මේ සඳහා රුපියල් මිලියන දෙකක ප්‍රතිපාදන වෙන් කොට ඇත. මේ යෝජනා ක්‍රම මගින් පවුල් 63,318 කට සෙත සැලසෙනු ඇත.



නව විදුලි උත්පාදන යන්ත්‍රය කැලණි ගඟෙන් එගොඩට ගනිද්දී

## යටිතල පහසුකම් සංවර්ධනය

පොදු ජනතාවට මෙන් ම විවෘත ආර්ථික ක්‍රමයක් කරා ගමන් කෙරෙන ශ්‍රී ලංකාව වැනි රටකට ඉතා අවශ්‍ය අංගයකි යටිතල පහසුකම්. මේ ගැන රජයේ විශේෂ අවධානය යොමු වී තිබේ. පසුගිය රජය මගින් අරඹා ඇති යටිතල පහසුකම් වැඩ බාධාවකින් තොරව කරගෙන යන අතර ම, අනුරාධපුරය, මාතර, මොණරාගල වැනි දුෂ්කර දිස්ත්‍රික්කයන්හි නව යෝජනා ක්‍රම ආරම්භකොට ඇත. මෙම යෝජනා ක්‍රම මගින් තෙත් කලාපයේ සිට වියළි කලාපය වෙතට ජලය හා විදුලි බලය ලබාදීම කෙරෙහි ක්‍රම මගින් තෙත් කලාපයේ සිට වියළි කලාපය වෙතට ජලය හා විදුලිබලය ලබාදීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කොට තිබේ. 1993 ලංකාවේ විදුලි බල පාරිභෝජකයින් 1,100,285 විය. මෙය 1994 දී 1,233,359 දක්වා ඉහළ ගිය අතර, 1995 දී මෙය 1,393,050 දක්වා අති විශාල ලෙස ඉහළ ගොස් ඇත. එහෙයින් ජලවිදුලියෙන් පමණක් මෙතරම් විශාල පිරිසකට විදුලිය සැපයීම රජයට අපහසු වීම නිසා වෙනත් විකල්ප මාර්ග සඳහා රජයේ අවධානය යොමු වී ඇත.

මේ අංශ සඳහා ආයෝජනය ක්‍රමවත්ව සැපයීමට ආයෝජන සංවර්ධන මණ්ඩලය යටතේ " යටිතල පහසුකම් සංවර්ධනය හා අයෝජනය පිළිබඳ ලේකම් කාර්යාලයක් ප්‍රතිසංවිධානය කොට ඇත. එසේම වාරිමාර්ග, විදුලිබලය, දුරකථන සේවා සහ මහා මාර්ග සංවර්ධනය සඳහා පෞද්ගලික ආයෝජකයින්ගේ සහාය ලබා ගැනීම පිණිස වත්මන් රජය ප්‍රබල ආයෝජකයින් සමඟ එකඟතාවයකට පැමිණ සිටී.

## සංචාරක කර්මාන්තය

1995 වසරේ ශ්‍රී ලංකාවට පැමිණි මුළු සංචාරකයින් සංඛ්‍යාව 403,101 ක් වේ. 1993 දී පැමිණි 392,290 හා 1994 පැමිණි 407,511 සංඛ්‍යාව හා සසඳන කල සැලකිය යුතු වර්ධනයක් දැකිය හැකි ය. 1994 වඩා 1995 වසරේ සංචාරකයින්ගේ පැමිණීම ඉතා සුළු වශයෙන් අඩු වී ඇත්තේ ජනවාර්ගික යුද්ධය, බෝම්බ පිපිරීම වැනි දේ නිසා ය. ශ්‍රී ලංකාවේ ජනවාර්ගික යුද්ධය නිසා මෙරටට සංචාරකයින්ගේ පැමිණීම බෙහෙවින් අඩුවී ඇතැයි ජනමාධ්‍ය වලින් කෙරෙන ප්‍රචාරය මෙ මගින් අසත්‍ය වේ. මෙයින් වැඩිම සංචාරකයින් කොටසක් පැමිණ ඇත්තේ බටහිර යුරෝපය, ජර්මනිය, එංගලන්තය, ප්‍රංශය, ජපානය වැනි ආසියාතික රටවල් වලින්ය.



සමෘද්ධි වැඩ සටහනේ දෙවන පියවර ආරම්භ වූ ද . . .

## රැකියා උත්පාදනය

මිලියන 6.48 ක් වන ශ්‍රමිකයන්ගෙන් මේ වන විට මිලියන 5.76 ක ශ්‍රමිකයෝ කුමන හෝ රැකියාවක යෙදී සිටිති. වෙනත් අංශවල ඇති වූ සංවර්ධන ක්‍රියාවලිය හේතුවෙන් කෘෂිකර්මය සඳහා දායක වූ රැකියා ප්‍රමාණය පහළ ගොස් ඇති අතර, කාර්මික නිෂ්පාදනය තොග සහ සිල්ලර වෙළඳාම් අංශයෙන් රැකියා දායකත්වය ඉහළ ගොස් තිබේ. නිෂ්පාදන අංශයේ රැකියා දායකත්වය 1971 වසරේ දී 9.3% ක් වූ අතර, 1994 වසරේ දී එය 14.4% ක් විය. මෙය තවදුරටත් වර්ධනය වෙමින් 1995 වසරේ දී 14.6% ක් වූයේ ය. මෙවැනි ම වර්ධනයක් අනෙක් අංශයන්හි දක්නට ලැබුණි.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ඔස්සේ ක්‍රියාත්මක ව්‍යාපෘති, රැකියා වර්ධනය සඳහා විශාල වශයෙන් දායක වී ඇත. 1992 දී 104,220 ක්ද, 1993 දී 122,165 ක්ද, 1994 දී 205,660 ක්ද වූ මෙම රැකියා ප්‍රමාණය 1995 දී ශ්‍රමිකයින් 235,367 ක් දක්වා ඉහළ නැංවිණ. මෙම රැකියා ප්‍රමාණය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අනුව 1996 මැයි මස වන විට තවත් 240,394 කින් ඉහළ ගොස් ඇත. මෙම සෘජු රැකියාවන්හි යෙදී සිටින ප්‍රමාණය 1995 දී 27,707 ක්ද, 1996 ජුනි වන විට 7,027 දක්වා ද, ඉහළ ගොස් තිබේ. ගරු ජනාධිපතිතුමියගේ විදේශ සංචාරයන්හි ප්‍රතිඵලයක් වශයෙන් ජපන්, චීන සහ කොරියන් ආයෝජකයින් නව ආයෝජකයන් මෙරට යෙදවූ විට මෙම රැකියා ප්‍රමාණයන් ඉතා විශාල ප්‍රමාණයකින් ඉහළ යනු ඇත.

සමෘද්ධි වැඩසටහන යටතේ තරුණ පිරිස් සඳහා රැකියා අවස්ථාවන් ගණනාවක් උත්පාදනය විය. මෙම වැඩ සටහන සඳහා උපාධිධාරීහු 1,110 ක් සමෘද්ධි කළමනාකරුවන් වශයෙන් ද, 29,568 දෙනෙකු සමෘද්ධි නියාමකයන් වශයෙන් ද, 1995 වසරේ 3 වන කාර්තුව වන විට තෝරාගෙන සිටියහ. මෙම ප්‍රමාණය 1996 වසරේ දී උපාධිධාරීන් 1500 දක්වා ද සමෘද්ධි නියාමකයින් 2956 කින් ද ඉහළ දැමීමට කටයුතු යොදා ඇත.

ශ්‍රම බලකා සමීක්ෂණය අනුව 1994 වසරේ 4 වැනි කාර්තුවේ සිට විරැකියා තත්ත්වය පහළ යමින් පවතී. 1994 3 වැනි කාර්තුවේ රැකියා නොමැත්තවුන්ගේ මුළු සංඛ්‍යාව 8,43,000 ක් වූ අතර, එය මුළු ශ්‍රම බලකායෙන් 13.7% ක් විය. 1995 වසරේ 2 වන කාර්තුවේ දී මේ තත්ත්වය 11.9% දක්වා පහතවැටුණි.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

1995 වසරේ දී, 1,70,131 දෙනෙකු විදේශ රැකියා සඳහා පිටත්ව ගොස් ඇත. 1996 ජනවාරි සිට ජූනි මස දක්වා 73,435 ක් විදේශ රැකියා සඳහා පිටත්ව ගොස් තිබේ. මීට අමතරව කොරියාව ශ්‍රී ලාංකිකයින් 10,000 ක් සඳහා රැකියා අවස්ථා ලබාදීමට දැනටමත් එකඟ වී ඇත.

දිස්ත්‍රික්ක ගණනාවක් තුළ ගෘහ සේවිකාවන් සඳහා නොමිලයේ පුහුණු වැඩ සටහන් හඳුන්වා දී තිබේ. මහජන බැංකුව සහ ලංකා බැංකුව විසින් විදේශ රැකියා සඳහා යන්නවුනට ණය සහන පදනමක් යටතේ ගුවන් ටිකට්පත් ලබාදීමේ ක්‍රමයක් ද හඳුන්වා දී ඇත.

## උපාධිධාරී අභ්‍යාස යෝජනා ක්‍රමය

පසුගිය රජය විසින් සැලැස්මකින් තොරව හඳුන්වා දී තිබුණු මෙම යෝජනා ක්‍රමය මඟින්, කිසිම රැකියා සුරක්ෂිතතාවයකින් තොරව රු. 2500/- ක දීමනාවක් ගෙවන අතර, ඔවුනට නියමිත වැඩ රාජකාරියක් මේ වන තෙක් පැවරී නොමැත. දැනට මෙම උපාධිධාරී අභ්‍යාස යෝජනා ක්‍රමය යටතේ උපාධිධාරීන් 5985 ක් සේවයේ යෙදී සිටින අතර, තවත් උපාධිධාරීන් 17,000 පමණ කිසිම ආදායම් මාර්ගයකින් තොරව සිටිති. මෙම තත්ත්වය නිසා සියළුම උපාධිධාරීහු අධික ලෙස මානසික පීඩාවට පත්ව සිටිති. මෙම උගතුන්ගේ සේවය අපතේ යැවීමේ බරැරුම්කම වටහාගත් වත්මන් රජය උපාධිධාරී අභ්‍යාසලාභීන්ගෙන් 50% ක් කෙලින්ම රජයේ සේවයට බඳවා ගැනීමටත් ඉතිරි අභ්‍යාසලාභීන් රජයේ දෙපාර්තමේන්තු හා ආයතන සඳහා පුරප්පාඩු ඇතිවන පරිදි අනුයුක්ත කිරීමටත් දැනට පියවර ගෙන ඇති අතර, මෙම ප්‍රශ්ණයට තිරසාර විසඳුමක් ලබාදීමට සුදුසු සැලැස්මක් සම්පාදනය කිරීමටත්, කටයුතු කෙරේ. රටක් සමෘද්ධිය කරා මෙහෙයවීමට රටේ උගත් තරුණ පරපුරේ හැකියාවන් යොදාගතයුතු බැව් වත්මන් රජය තේරුම් ගෙන ඇති බව මෙම ව්‍යායාමයෙන් පැහැදිලි වේ.

## දිළිඳුකම පිටුදැකීම - සමෘද්ධි ව්‍යාපාරය

ජනවාර්ගික යුද්ධය හැරුනකොට ශ්‍රී ලංකාවට මුහුණ දීමට ඇති ප්‍රධානතම ප්‍රශ්නය දිළිඳුකමයි. එයටත් හේතුවී ඇත්තේ මෙම ජනවාර්ගික යුද්ධය වෙනුවෙන් වත්මන් රජයට දැරීමට සිදුවී ඇති අතිමහත් වියදමයි. සෑම මිනිත්තුවක් පාසාම රු. 48,000 ක් වියදම් කිරීමට සිදුවී ඇති මෙම යුද්ධයෙහි කෙළවරක් දැකීමට හැකි නම් ශ්‍රී ලංකාවෙන් දිළිඳුකම පිටුදැකීම විශාල ප්‍රශ්නයක් නොවනු ඇත. මෙම තත්ත්වය වටහාගත් වත්මන් රජය වෙනත් උපාය මාර්ගස්ථ එනම් දිළිඳුකම පිටුදැකීම සඳහා සියළු අවශ්‍යතාවයන් ගැබ්වූ එක් වැඩසටහනක් වශයෙන් 1995 අගොස්තු මස දී "සමෘද්ධි " ව්‍යාපාරය අරඹන ලදී. පුළුල් සමීක්ෂණයකින් පසුව දිවයිනේ සෑම ග්‍රාම නිලධාරී කොට්ඨාශයකින්ම දිළිඳු පවුල් 1,201,329 ක් මෙම ව්‍යාපෘතිය සඳහා තෝරා ගැණින. මෙයින් ඉතාම දිළිඳු පවුල්වලට රු : 1000/- බැගින් ද, අනෙකුත් පවුල්වලට රු: 500/- බැගින් ද ලැබේ. මෙම වැඩසටහන දීප ව්‍යාප්තව ක්‍රියාත්මක වන්නකි. සමෘද්ධි කළමණාකරුවන් වශයෙන් උපාධිධාරීන් 1000 ක් පුහුණු කොට සමෘද්ධි නියාමකයින් 23,000 ක් දැනටමත් පත්කොට ඇති අතර, මෙම ප්‍රමාණය ඉදිරියේ දී ඇතිවන අවශ්‍යතාවයන් අනුව වැඩි කරනු ලැබේ. සෑම ගම්මානයකින්ම සමෘද්ධි බලකායන් පිහිටුවා සෑම සමෘද්ධිලාභියෙකුටම තම හැකියාවන් ගොනුකර ගැනීමටත්, ග්‍රාමීය පෙදෙස්හි ඵලදායී රැකියා සොයා ගැනීමටත්, හා එමගින් ආදායම් ඉපැයීමේ අවශ්‍යතාවන් සලසා ගැනීමටත් සමෘද්ධි ව්‍යාපාරය සමත් වනු ඇත.

## ප්‍රාදේශීය හා ග්‍රාමීය සංවර්ධනය

ප්‍රාදේශීය හා ග්‍රාමීය සංවර්ධනය පදනම්කොට ගෙන 1979 දී ආරම්භ කරන ලද ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපාරයේ මූලික අරමුණ වූයේ ප්‍රාදේශීය මට්ටමින් යටිතල පහසුකම් දියුණුකොට ප්‍රාදේශීය

මට්ටමින් සමාජ හා ආර්ථික විෂමතා අවම කිරීමත්ය. මෙහිදී දක්නට ලැබුණ ප්‍රධාන දුර්වලතාවය වූයේ මෙම සංවර්ධන ව්‍යාපාරයන් ආරම්භ කළ සියළු දිස්ත්‍රික්කයන් එක හා සමාන ලෙස දියුණුවෙන් අඩු ප්‍රදේශයන් ලෙස සැලකීමයි. එහෙත් අප රටේ සමහර දිස්ත්‍රික්කයන් සැලකිය යුතු තරමින් සංවර්ධනය වූ දිස්ත්‍රික්කයන් වූ අතර, සමහර දිස්ත්‍රික්කයන් සංවර්ධනයෙන් ඉතා දුරස්තර වූ බෙහෙවින් දිළිඳු ජනකොටස්වලින් යුත් දිස්ත්‍රික්කයන් වීමයි. මේ සඳහා දැක්විය හැකි හොඳම උදාහරණයක් නම්, සැලකිය යුතු තරමින් ප්‍රමාණවත් සංවර්ධනයක් ඇති කුරුණෑගල හා මාතර දිස්ත්‍රික්කයන් මේ සඳහා මුලදී ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා තෝරා ගැනීමත්, ඉතාමත් අඩු පහසුකම් ඇති ඉතා දිළිඳු ජන කොටසක් වාසය කරන මොණරාගල වැනි දිස්ත්‍රික්කයන් මෙම සංවර්ධන ව්‍යාපාරයන් සඳහා තෝරා නොගැනීමත්ය.

මෙම අසාධාරණ තත්ත්වය කෙරෙහි සැලකිලිමත් වූ වත්මන් රජය ප්‍රාදේශීය මට්ටමින් විවිධ සමාජ විෂමතා ඇති දිස්ත්‍රික්කයන් තෝරා ගෙන ඒවායේ සංවර්ධන කටයුතු සඳහා නව අරුතක් දීමය. එනම්, ප්‍රාදේශීය මට්ටමින් සමාජ හා ආර්ථික විෂමතා අවම කිරීම මඟින් " දුගී බව තුරන් කිරීම " සහ එමඟින් ග්‍රාමීය දිළිඳු ජනතාව ප්‍රධාන ජන ප්‍රවාහයට සම්බන්ධ කොට සියළුම දෙනාටම එක හා සමාන ලෙස මානව හා ආර්ථික සම්පත් බෙදී යන පරිදි මුළු දිවයිනම මානව හා ආර්ථික අතින් සමාන වූ සමෘද්ධියක් කරා ගෙනයාමය.

මේ අරමුණින් 1995 වසරේ දී ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රම සඳහා රුපියල් මිලියන 1948 ක් වෙන් කළේය. මේ වැඩ සටහන සඳහා 1994 වසරේ දී වෙන් කරන ලද්දේ රුපියල් මිලියන 760 කි. දිවයිනේ දිස්ත්‍රික්ක 14 ක ක්‍රියාත්මක වන මේ වැඩ සටහනින් ප්‍රජා සංවර්ධන කටයුතු, ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය, රැකියා අවස්ථාවන් උපරිම කිරීම හා ප්‍රදේශයේ පවත්නා සම්පත් උපයෝගී කරගෙන ආදායම් ඉපයීමේ කටයුතු ආදිය ආවරණය කෙරේ. ඉහත සඳහන් කළ නව රජයේ " දුගීකම " නැතිකිරීමේ මූලික ආකල්පය අනුව දිවයිනේ ඉතාමත් පසුබෑමට ලක්වූ දිස්ත්‍රික්ක දෙකක් වන මොණරාගල හා අනුරාධපුර දිස්ත්‍රික්කයන් සඳහා නව වැඩ සටහන් 1995 දී හඳුන්වාදෙනු ලැබීය. මෙයින් මොණරාගල දිස්ත්‍රික්කය සඳහා සංවර්ධන වැඩ සටහන් දෙකක් ක්‍රියාත්මක වේ. එකක් කෘෂිකර්මයෙන් ජීවත්වන මොණරාගල දිස්ත්‍රික්කයේ ජනතාව සඳහා එම ප්‍රදේශයේ මධ්‍යම ප්‍රමාණයේ වැව් 8 ක් ප්‍රතිසංස්කරණය කොට ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපාය වන කෘෂිකර්මාන්තය සඳහා ජලය ලබා දීමෙන් ඔවුන් ස්වයංපෝෂිත කිරීමය. අනෙක් ව්‍යාපෘතිය වෙනත් දිස්ත්‍රික්කයන්හි ක්‍රියාත්මක වන ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතීන්ට සමාන වූ ප්‍රදේශයේ පොදු සංවර්ධන කටයුතු සඳහා ක්‍රියාත්මක වන්නකි. මොණරාගල දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සඳහා යුරෝපා සංගමය ද, අනුරාධපුර දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සඳහා ජාත්‍යන්තර ආසියා සංවර්ධන පදනම සමඟ ස්වීඩනය සහ ජපානය ද උදව් දීමට එකඟ වී ඇත.

එසේම නැගෙනහිර පළාත් සඳහා දිස්ත්‍රික් සංවර්ධන සැලැස්මක් 'නොරාඩ්' ආයතනයේ අනුග්‍රහයෙන් ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත. දිවයිනේ දකුණු ප්‍රදේශය සඳහා ද කඩිනම් සංවර්ධන වැඩ සටහනක් දියත් කොට තිබේ. මේ වන විට දකුණු පළාත් සංවර්ධන අධිකාරියක් පිහිටුවීමට කැබිනට් අනුමැතිය ලැබී ඇති අතර, දැනට එම පළාතේ ක්‍රියාත්මක වන සියළු සංවර්ධන යෝජනා ක්‍රම සම්බන්ධීකරණය කිරීමටත්, විදේශ ආධාර හා පෞද්ගලික ආයෝජන උපරිම කිරීමටත්, රජය විසින් දකුණු පළාත සඳහා ජනාධිපති කාර්ය සාධන බලකායක් පත්කොට තිබේ. දැනට දකුණු පළාතේ ක්‍රියාත්මක වන සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම වේගවත් කිරීමත්, වැඩි රැකියා අවස්ථා සහ

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

ආදායම් උපදවීමේ මාර්ග සහිත නව සංවර්ධන යෝජනා ක්‍රම හඳුනා ගැනීමත්, මේ ව්‍යාපෘතිය මගින් සිදු කෙරේ. එසේම දිවයිනේ මහජන ඡන්දයෙන් පත් වූ සියළුම මන්ත්‍රීවරුන් සඳහා රුපියල් මිලියන 562.5 ක මුදලක් දිස්ත්‍රික් සංවර්ධන කටයුතු සඳහා රජයෙන් ලබාදී තිබේ. පසුගිය රජය කාලය තුළ නොසලකා හැර තිබූ නඩත්තු වැඩ සඳහා විමධ්‍යගත අයවැයෙන් අවම වශයෙන් 30% ක් වැය කිරීමට වත්මන් රජය තීරණය කොට ඇත. මේ යටතේ ව්‍යාපෘති 1481 ක වැඩ මේ වන විට නිමකොට තිබේ.

### අල්ලස හා දූෂණය නැති කිරීම

අල්ලස, දූෂණය හා වංචාව සමාජයෙන් මුලිනුපුටා දැමීමට ක්‍රියා කිරීම පසුගිය මහ මැතිවරණයේ දී පොදු පෙරමුණ විසින් දෙන ලද එක් ප්‍රමුඛ ප්‍රතිඥාවක් විය. අල්ලස හා දූෂණය මර්දනය කිරීමට නව මාදිලියේ ආයතන පිහිටුවා එමගින් ක්‍රියා කරන බව පොදු පෙරමුණේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ ද සඳහන් විණි.

අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා කොමිෂන් සභාවක් පිහිටුවීමේ පනත (1994 අංක 14 ) සම්මත කරන ලද්දේ පොදු පෙරමුණු රජයේ මුල් වසරේ මූලාරම්භයේ දීමය. ඊට අමතරව 1994 අංක 20 දරණ අල්ලස් පනත ද පාර්ලිමේන්තුව මගින් සම්මත කෙරිණි.

ඉක්බිතිව අල්ලස් පමණක් නොව දූෂණ ද සෙවිය හැකි වන පරිදි විශේෂ කොමිෂන් සභාවක් ද පත් කරන ලදී. 1994 අංක 19 දරණ පණතින් අල්ලස් හා දූෂණ සෙවීමේ ස්ථාවර කොමිෂන් සභාවක් පිහිටුවීම විශේෂ පියවර වූ අතර, එය මින් පෙර කිසිදු රජයක් යටතේ ජන ජීවිතය හා සමාජය පවිත්‍ර කිරීම සඳහා නොගන්නා ලද අන්දමේ විශේෂ සිද්ධියක් විය. ඒ යටතේ අල්ලස් කොමසාරිස් තනතුර අහෝසි වී, අධ්‍යක්ෂ ජනරාල් පදවියක් පිහිටුවනු ලැබිණ. ඒ යටතේ නඩු පැවරීමේ තීරණ පෙරදී මෙන් නීතිපතිවරයාට නොව අල්ලස් කොමිසමේ අධ්‍යක්ෂ හා ඔහුගේ නිලධාරි මණ්ඩලයට පවරා දෙන ලදී. මේ පනතින්ම අල්ලස් සඳහා දෙන දඬුවම් වැඩි කරන ලද අතර, අල්ලස් චෝදනා ලබන පුද්ගලයන් ද එක ගොනුවට නොගෙන, වර්ග කොට විග්‍රහ කිරීම ද සිදු කර ඇත.



නියෝජ්‍ය ආරක්ෂක අමාත්‍ය ජෙනරාල් අනුරුද්ධ රත්වත්තේ මහතා යාපනයේ සිංහ ධජය ඔසවමින්

මේ සියල්ල හුදු ඇස්බැන්දුමකින් ජනතාව රවටීම නොව අල්ලස, දූෂණය හා වංචාව පිටු දැකීම සිය පරමාදර්ශය කර ගත් රජයක ක්‍රියාදාමයක් බව අමුතුවෙන් කිව යුතු ද? එය ඇස් පනා පිට දැනටමත් පෙනෙන්නට ඇති දෙයකි. දේශපාලන යෝජනාවලිය කොටි සංවිධානයට එරෙහිව තීරණාත්මක සංග්‍රාමයක යෙදෙමින්ම, ද්‍රවිඩ ජනතාවගේ සාධාරණ ඉල්ලීම් ඉටු කරනුවස් රජය දේශපාලන යෝජනාවලියක් ඉදිරිපත් කර තිබේ.

යුද්ධය සිදුවන්නේ දේශපාලන යෝජනාවන්ට හා ජනතා සුභ සාධනයට එරෙහිව නැගී සිටින එල්.ටී.ටී.ඊ. සංවිධානයට විරුද්ධවය. එය සමස්ථ ද්‍රවිඩ ජනතාවට එරෙහිව කරනු ලබන යුද්ධයක් නොවේ. යුද්ධයේ අරමුණ වන්නේ එල්.ටී.ටී.ඊ.ය පරාජය කරන අතරම දේශපාලන යෝජනා ක්‍රියාවට නැංවීමට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීමය.

අනික් අතට, හුදෙක් යුද්ධයෙන් එල්.ටී.ටී.ඊ. ය මර්ධනය කිරීමෙන් පමණක් ප්‍රශ්නයට විසඳුම් ලැබෙන්නේ නැත. දෙමළ ජනතාවගේ සාධාරන දුක් ගැනවිලි තිබෙනතාක් කල් එල්.ටී.ටී.ඊ. ය වැනි තවත් සංවිධාන වලට ඉදිරියට එන්නට අවස්ථාවක් සැළසේ. ද්‍රවිඩ ජනතාවගේ ප්‍රශ්න ත්‍රස්තවාදය වපුරාලිය හැකි සරු තෝතැන්නකි. අන්තවාදීන් මෙන් නොව වත්මන් රජයත් ජනාධිපතිතුමියත් මේ බව මනාව අවබෝධ කරගෙන සිටිති.

ජනවාර්ගික ප්‍රශ්න විසඳීම සඳහා දේශපාලන විසඳුම් මාලාවක් රජය ඉදිරිපත් කර ඇත්තේ මේ අරමුණ පෙරදැරි කරගෙනය. දේශපාලන යෝජනා මාලාව රජය ජනතාව මත බලහත්කාරයෙන් පටවන්නේ නැත. වෙනත් කිසිම රජයක් නොකළ ආකාරයට මෙම යෝජනා මාලාව දැන් පුළුල් ජනතා සංවාදයට ලක්වී අවසන්ය. ඒ පිළිබඳ වාද විවාද තර්ක විතර්ක සියල්ලක්ම දැන් ජනතාව දනී. දැන් මෙම යෝජනාව පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ සාකච්ඡාවට භාජනය වෙමින් පවතී. තේරීම් කාරක සභාවේදී එකහත්වයක් ඇතිවුවහොත් එය පණතක් ලෙස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට සාකච්ඡාවට භාජනය වනු ඇත. එය තුනෙන් දෙකක ඡන්දයෙන් අනුමත විය යුතුය. අනතුරුව යෝජනා මාලාව ජනමත විචාරනයකට ද ලක් කෙරේ. මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක වන්නේ ජනමත විචාරණයෙන් එය සම්මත වුවාට පසුවය.

## ඒකීය හා එක්සත්භාවය පිළිබඳ ගැටළු

දේශපාලන යෝජනා මාලාව පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවට යොමු වී ඇති මෙම අවස්ථාවේ ප්‍රධාන ගැටළුවක් වශයෙන් ඉස්මතු වී ඇත්තේ ශ්‍රී ලංකාව ඒකීය රාජ්‍යයක් විය යුතු ද එක්සත් රාජ්‍යයක් විය යුතු ද යන ප්‍රශ්නයයි. බලතල නිසි අයුරින් බෙදා දීමට නම් එය කළහැක්කේ එක්සත් රාජ්‍ය සංකල්පය තුල බව රජයේ පිළිගැනීමයි. එහෙත් ඒකීය රාජ්‍ය සංකල්පය අහෝසිවී ගියහොත් රට කැබැලිවිය හැකි යයි ඇතැම් දෙනා තර්ක කරති. මෙම ඒකීය, එක්සත් යන තර්ක දෙකට විසඳුමක් වශයෙන් අතරමැදි වැඩපිළිවෙලක් එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී කේ.එන්.චොක්සි මහතා යෝජනා කළේය. ඔහු කියන අන්දමට ශ්‍රී ලංකාව ඒකීය රාජ්‍යයක්ය යන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දෙවන වගන්තිය එසේම තිබෙන්නට ඉඩ හැරිය යුතුය. බලතල බෙදීමට අදාළ සියළු යෝජනා 76 වන වගන්තියට ඇතුලත් කළයුතු අතර, ඒකීයභාවය පිළිබඳ වගන්තිය ක්‍රියාත්මක වන්නේ 76 වන වගන්තියේ සඳහන් බලය බෙදීමේ කොන්දේසි වලට යටත්ව යයි චොක්සි මහතා පෙන්වා දෙයි. පාර්ලිමේන්තුව සතු බලතල අන්සතු කළ නොහැකිය යන වගන්ති ඇතුළත් 76 වන වගන්තිය සංශෝධනය විය යුතුය. චොක්සි මහතාගේ මෙම සංශෝධනය පිළිගත හැකි බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක අමාත්‍ය මහාචාර්ය ජී.එල්.පීරිස් මහතා ප්‍රකාශ කළේය. ඒ අනුව අදාළ සංශෝධනය ද ඔහු දැන් ඉදිරිපත් කොට ඇත. එහෙත් ප්‍රධාන විපක්ෂ කණ්ඩායම් එම සංශෝධනය පවා පිළිගැනීමට අදිමදි කරන බවක් පෙනේ.

මේ අවස්ථාවේ සියළු කොටස් අතර, පොදු එකහත්වයක් ඇතිකර ගැනීමට නොහැකිවුවහොත් තවත් වසර ගණනාවක් යනතුරු මේ රට එකම ලේ ගංගාවක් වනු ඇත. යුද්ධය සඳහා දරන අතිවිශාල මුදල් සම්භාරය තවතවත් වැඩි කිරීමට එය හේතුවනු ඇත. එමගින් ජනතාවගේ ජීවන තත්ත්වයත් රටේ සංවර්ධනයත් අඩාල වන බව අමුතුවෙන් කිවයුතු නැත. එබැවින් මේ අවස්ථාවේ අප පෙරමුණු තුනක කෙරෙන සටනක් මගින් රටත් ජනතාවත් ආරක්ෂා කරගත යුතුව ඇත. සාමයට එරෙහිව ත්‍රස්තවාදී ප්‍රචණ්ඩක්‍රියා වල පිහිට පතන එල්.ටී.ටී.ඊ යට එරෙහිව පමණක් කොන්දේසි විරහිතව යුද්ධ කළයුතුය. එසේ යුද්ධ කොට ඔවුන් මර්ධනය කරන අතරම දෙමළ ජනතාව වෙනුවෙන් සාධාරණය ඉටු කිරීමට ද වගබලාගත යුතුය. එම සාධාරණය ඉටු කළ හැක්කේ දේශපාලන යෝජනා

ක්‍රියාවට නැංවීමෙන් පමණකි. අනික් අතට අප සාධාරණ යුද්ධයක් කරන බව අන්තර් ජාතික පිළිගැනීමට ලක් කළ හැක්කේ ද දේශපාලන යෝජනා අවංක ලෙස ඉදිරියට ගෙන යෑමෙන් පමණකි. පසුගිය පාලන සමයේ දී යුද්ධය ඉදිරියට යනවිට අන්තර් ජාතික බලපෑම් එල්ලවූයේ දෙමළ ජනතාවගේ සාධාරණ අයිතිවාසිකම් පිළිබඳව කිසිම තැකීමක් නොකළ නිසාය. අද අන්තර් ජාතික ප්‍රජාව මේ යුද්ධයේ දී රජයට ආධාර කරයි. එදා මෙන් නොව අද ජාත්‍යන්තර මතය ශ්‍රී ලංකාවට වාසිදායක ලෙස බරවී ඇත. අන්තවාදීන් තර්ක කරන පරිදි යුද්ධය පමණක් ඉදිරියට ගෙන ගියහොත්', ජාත්‍යන්තර වශයෙන් ශ්‍රී ලංකාවට අත්වී තිබෙන කීර්තිය පළුදු වී යන්නේය. එමනිසා යුද්ධයත්, දේශපාලන යෝජනාත් එකම අරමුණක් ඔස්සේ ඉදිරියට ගෙන යන ප්‍රතිපත්ති දෙකක් බව අප අවබෝධ කරගත යුතුය. යුද්ධය සාර්ථක කර ගැනීම සඳහා අප පාවිච්චි කරන යෝධ කාලතුවක්කු ව වන්නේ දේශපාලන යෝජනා මාලාවය. අනික් අතට උතුරේ ජනතාවට දේශපාලන යෝජනා මාලාව පිළිබඳව දැනුමක් ලබාදීම සඳහා අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීමට හැකි බාධක ඉවත් කිරීම සඳහා අප යොදාගන්නා ලොකුම අවිය යුද්ධය.

උතුරු නැගෙනහිර පුනරුත්ථාපන හා සංවර්ධන කටයුතු ද රජය අමතක කොට නැත. දශක එකහමාරකට වැඩි කාලයක් මුළුල්ලේ යුද්ධයෙන් විනාශ වී ගිය උතුරු නැගෙනහිර ප්‍රදේශ යළි පුනරුත්ථාපනය කළයුතුව ඇත. ඒ සමගම එම ප්‍රදේශ වල සිවිල් පරිපාලනයත්, ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන රටාවත් යළි ස්ථාපිත කළයුතුව තිබේ. මෙම අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා අපට යුද්ධයත් දේශපාලන යෝජනාත් සංවර්ධනයත් යන අංශ තුනම අවශ්‍යය. අවසාන අරමුණ වන්නේ දෙමළ ජනතාව ඇතුළු සියළු සුළු ජාතික කොටස් වලට ද සමාන අයිතිවාසිකම් සළසා මුළු රටපුරා සාමයත්, ප්‍රජාතන්ත්‍රවාදයත්, නිදහසත් සමෘද්ධියත් ස්ථාපිත කිරීමයි.



යාපනයේ දුවිව ජනයා නැවතත් එහි පදිංචියට

## ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ප්‍රශ්නය

ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ප්‍රශ්නය පිළිබඳ ඉතිහාසය අප නිදහස ලබන්නටත් කලින් පැවැති වකවානුව දක්වා විහිදී යන්නකි. බ්‍රිතාන්‍ය පාලනයෙන් නිදහස ලබා ගන්නට සිංහල හා දෙමළ නායකයන්' අරගල ආරම්භ කළ මුල් අවදියේ සිටම මේ ප්‍රශ්නයේ මුල් බීජුවට වැපිරුණු බව රහසක් නොවේ. 50 ට 50 හේ ඉල්ලීම, සිංහල හා දෙමළ භාෂා සමතැන සම්බනධයෙන් ඇති වූ ගැටළුව ආදී කරුණු මෑත ඉතිහාසයේ ජනවාර්ගික ප්‍රශ්නය සමග බැඳී පැවැති බව අමතක කළ නොහැකිය. ශ්‍රී ලංකාවේ දෙමළ ජනතාව හා ඔවුන්ගේ නායකයන් මේ පිළිබඳව ඉදිරිපත් කළ ඉල්ලීම් හා මතිමතාන්තර සම්බන්ධයෙන් විවෘත හා අවංක සාකච්ඡා පැවැතියා නම් එය ඉතා විරළය. මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් විවෘත ලෙස අදහස් දැක්වීමට එදා සිටි ශ්‍රී ලංකාවේ දේශපාලන නායකයන් එතරම් උනන්දුවක් දැක්වූයේ නැත. වරින්වර ඒ පිළිබඳව උනන්දුවක් දැක්වූ ප්‍රබුද්ධ නායකයන් ප්‍රශ්න විසඳීම සඳහා යෝජනා ඉදිරිපත් කළද, පටු දේශපාලන වාසි තකා ක්‍රියා කළ අයගේ බලපෑම නිසා එම ප්‍රශ්නය විසඳුනේ නැත.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

විවිධ ජන කොටස් වෙසෙන රටකට ඉතාම සුදුසු පාලන ක්‍රමය වන්නේ ෆෙඩරල් ආණ්ඩු ක්‍රමයක් බව 1927 තරම් ඈත කාලයකදී ප්‍රකාශ කිරීමට තරම් දිවංගත අගමැති එස්.ඩබ්.ආර්.ඩී බණ්ඩාරනායක මැතිතුමා එදා දූරදර්ශී මෙන්ම නිර්භීත ද විය. පසුව එතුමා 1956 දී බලයට පත් වී සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කිරීමෙන් අනතුරුව ද්‍රවිඩ භාෂාවට නිසි තැන ලබාදීමේ වැඩපිළිවෙලක් යෝජනා කළේය. ඉන් අනතුරුව මේ ප්‍රශ්නය විසඳීම සඳහා බණ්ඩාරනායක මැතිතුමා 1957 දී රට සභා පනත ඉදිරිපත් කළේය. මෙය සුප්‍රකට බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුමේ ප්‍රතිඵලයක් විය. එහෙත් එදා සිටි අන්තවාදීන්ගේ බලපෑම නිසා මෙම ප්‍රයත්නය අත්හැර දැමීමට සිදුවිය. ඉන්පසුව අගමැති ඩඩ්ලි සේනානායක මහතා ෆෙඩරල් නායක චෙල්වනායගම් මහතා සමග ගිවිසුමකට එළැඹියත් එයද අසාර්ථක විය. 1966 දෙමළ භාෂා විශේෂ විධිවිධාන පනත හේතුකොට ගෙන අර්බුදකාරී තත්ත්වයක් ඇතිවිය. මින් අනතුරුව වරින්වර ප්‍රශ්නය විසඳීමේ යෝජනා ඉදිරිපත් වුවද ඒ ඒ වකවානුවල සිටි විරුද්ධ පක්ෂ පටු දේශපාලන වාසි තකා විසඳුම් යෝජනා වලට විරුද්ධවීම නිසා ප්‍රශ්නය එන්ට එන්ටම අවුල් සහගත තත්ත්වයකට පත්විය.

ජනවාර්ගික ප්‍රශ්නය වඩාත් දරුණු අතට හැරුනේ 1977 න් පසුවය. මෙම ප්‍රශ්නය විසඳන බව 1977 මහා මැතිවරණයේ දී එක්සත් ජාතික පක්ෂය ප්‍රතිඥා දී තිබුණද, එයින් කිසිදු ප්‍රතිඵලයක් ලැබුණේ නැත. ප්‍රතිඵලය වූයේ මැතිවරණයෙන් පසුව ප්‍රශ්නය විසඳනු වෙනුවට ජාතිවාදී ගැටුම් උග්‍රවීමයි. 1979 - 81 -83 යන අවුරුදු වලදී වරින් වර ජාතිවාදී ගැටුම් මතුවිය. මෙහිදී විශේෂයෙන් කැපී පෙනෙන්නේ 1983 කළු ජූලියයි. මෙය මේ රටේ ඇති වූ ජාතිවාදී ගැටුම් වල උච්චතම අවස්ථාව සේ සැලකිය හැකිය. ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ප්‍රශ්නයත්, යුද්ධයත්, ත්‍රස්තවාදයත් පමණක් නොව මුළු රටේම ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන රටාවත් මුළුමනින්ම වෙනස් කළේ 1983 කළු ජූලිය ය. මෙය පටු දේශපාලන වාසි තකා සංවිධානාත්මකව ක්‍රියාත්මක කළ වැඩ පිළිවෙලක් බව දැන් හෙළිවී තිබේ.

මුළුමහත් ද්‍රවිඩ ජනතාව සටන්කාමී දේශපාලන සංවිධාන වෙත තල්ලුකර යැවීමට තුඩුදුන්නේ මේ ප්‍රශ්නය ය. කළු ජූලියෙන් පසුව එක්සත් ජාතික පක්ෂය හඳුන්වාදුන් 6 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නිසා ප්‍රජාතන්ත්‍රවාදීව තේරී පත්වී සිටි ද්‍රවිඩ මන්ත්‍රීවරුන්ට ද ආසන අහිමිවිය. ද්‍රවිඩ දේශපාලනය සඳහා තිබූ එකම ප්‍රජාතන්ත්‍රවාදී නියෝජනය ද අහෝසි වී ගියේය. මේ සිද්ධිය නිසා එක් පැත්තකින් ශ්‍රී ලංකාව ජාත්‍යන්තර වශයෙන් අප්‍රසාදයට පත් වූ අතර, අනික් පැත්තෙන් ද්‍රවිඩ සටන්කාමී සංවිධාන වල ශක්තිය වර්ධනය වන්නට පටන් ගත්තේය. ඒ සමගම දකුණේ ප්‍රජාතන්ත්‍රවාදී පාලන රටාවට ද වැටකඩොළු බැඳෙන්නට විය.

## 83 කළු ජූලියෙන් පසු

83 කළු ජූලියේ සිදුවීම් වලින් පසුව එවකට පැවැති එක්සත් ජාතික පක්ෂ රජය මේ ප්‍රශ්නය දෙස බලන ආකාරයේ පැහැදිළි වෙනසක් දකින්නට ලැබුණි. වරින් වර සාකච්ඡා පැවැති නමුත් මෙය ජනවාර්ගික ප්‍රශ්නයක ස්වරූපයෙන් හඳුනා ගැනීමට එදා සිටි පාලකයෝ අකමැත්තක් දැක්වූහ. තනිකරම යුද්ධයෙන් හා රාජ්‍ය ත්‍රස්තවාදයෙන් ප්‍රශ්නය විසඳිය හැකියයි ඔවුහු කල්පනා කළහ. ද්‍රවිඩ ජනතාවගේ සාධාරන ඉල්ලීම් හෝ ප්‍රශ්න ගැන ඔවුන් සැළකිල්ලක් දැක්වූයේ නැත. හුදෙක් යුද්ධය හා රාජ්‍ය ත්‍රස්තවාදය වර්ධනය වීමේ ප්‍රතිඵලය වූයේ උතුරේ තරුණ කොටස් වඩ වඩාත් සන්නද්ධ සංවිධාන වෙත යොමු වීමයි. බහුතර දෙමළ ජනතාව තමන්ගේ ප්‍රශ්න වලට විසඳුම් ලබාදිය හැක්කේ සන්නද්ධ සංවිධාන වලට පමණකැයි යන මතයට අකමැත්තෙන් වුවද පෙළඹෙන බවක් පෙනුනි.. එහි ප්‍රතිඵලයවූයේ එල්.ටී.ටී.ඊ සංවිධානය ලෝකයේ ප්‍රබලතම ගරිල්ලා සංවිධානයක් බවට පත්වෙමින් උතුරු නැගෙනහිර ප්‍රදේශ තම අණසකට යටත් කර ගැනීමය.

## ඉන්දු - ලංකා ගිවිසුම හා පලාත් සභා

ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ප්‍රශ්නය පිළිබඳ ඉතිහාසයේ මීළඟ වැදගත්ම හා තීරණාත්මක අවස්ථාව උදාවුයේ 1987 ඉන්දු - ශ්‍රී ලංකා ගිවිසුමත් සමගය. ඉන්දීය සාම සාධක හමුදාව ශ්‍රී ලංකාවට පැමිණියේත් පළාත් සභා වැඩපිළිවෙලට මුල පිරුණේත් මේ ගිවිසුම සමගය. මෙය බෙහෙවින් ප්‍රායෝගික හා යථාර්ථවාදී වැඩපිළිවෙලක් වුවද, එවකට රජයේ සිටි බලවතුන්ගේම විවිධ බලපෑම් හේතුකොට ගෙන මෙම උපාය මාර්ගය සාර්ථකවූයේ නැත. විශේෂයෙන්ම ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහතා බලයට පත්වීමෙන් පසුව ඇතිවූ තත්ත්වය හේතුකොට ගෙන වාර්ගික ප්‍රශ්නය තවත් අවුල්වී ත්‍රස්තවාදය සීඝ්‍රයෙන් පැතිරෙන්නට පටන් ගත්තේය. එම වකවානුවේ දකින්නට ලැබුණු විශේෂ ලක්ෂණයවූයේ ජනාධිපති ප්‍රේමදාස මහතා සහ එල්.ටී.ටී.ඊ. ය අතර, ඇති වූ මිත්‍ර සන්ධානයයි. එල්.ටී.ටී.ඊ.යට එම රජයෙන් අවි ආයුධ සහ මුදල් ලබාදීම, අද ප්‍රසිද්ධ රහසකි. මෙම අදූරදර්ශී ක්‍රියා මාර්ගයේ ප්‍රතිඵලයවූයේ ඉන්දු- ශ්‍රී ලංකා මිත්‍රත්ත්වය පළුදුවීම පමණක් නොවූ එල්.ටී.ටී.ඊ ය වඩාත් ශක්තිමත් වීමය.

1988 ජනාධිපතිවරණය වනවිට ජනවාර්ගික ප්‍රශ්නය විසඳීමේ තවත් යථාර්ථවාදී වෑයමක් ගැන වාර්තාවිය. ඒ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය සිය ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ, වෙනුවෙන් නිකුත් කළ මැතිවරණ ප්‍රකාශනයේ ජනවාර්ගික ප්‍රශ්නය විසඳීමට යෝජනා කර තිබූ වැඩ පිළිවෙලය. එදා පැවැති සියළුම දේශපාලන පක්ෂ විශේෂයෙන්ම මහජන එක්සත් පෙරමුණ සහ ද්‍රවිඩ සංවිධාන ද එම වැඩපිළිවෙල ගැන සිය කැමැත්ත පළකොට තිබුණි. එහෙත් ජනාධිපතිවරණයෙන් ප්‍රේමදාස මහතා ජය ගැනීම නිසා එම වැඩපිළිවෙල ඉදිරියට ගියේ නැත. එල්.ටී.ටී.ඊ ය සමග ඔහු පැවැත්වූ සාකච්ඡා වලින් ද ප්‍රතිඵලයක් ලැබුණේ නැත. ප්‍රේමදාස මහතාගෙන් පසුව බලයට පැමිණි ඩී. බී. විජේතුංග ජනාධිපතිතුමා ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ප්‍රශ්නයක් නැතැයි ප්‍රසිද්ධියේම ප්‍රකාශ කළ නිසා තත්ත්වය වඩාත් අවුල් වන්නට විය. ශ්‍රී ලංකාවේ ඇත්තේ ත්‍රස්තවාදය පමණකැයි යන විශ්වාසය තුළ කටයුතු කිරීම නිසා ප්‍රශ්නය දිගින් දිගටම උග්‍ර අතට හැරුණි.

## 1994 මැතිවරණයෙන් පසු

1994 මැතිවරණය වන විට යුද්ධයෙන් මේ රටේ ජනතාව හෙම්බත්වී සිටියහ. මේ යුද්ධය තවදුරටත් ගෙන යෑමට ඔවුන්ට කිසිදු අවශ්‍යතාවක් තිබුනේ නැත. යුද්ධය අවසන් කළයුතුය යන හඬ දසතින් නැගෙන්නට විය. මෙම ජනතා ඉල්ලීම ඉටු කිරීමට පෙරමුණ ගත්තේ වත්මන් ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියයි. මැතිවරණ 4 ක් ඔස්සේ, එනම් දකුණු පළාත් සභා මැතිවරණය, බස්නාහිර පළාත් සභා මැතිවරණය හා 1994 මහා මැතිවරණය හා එම වසරේ පැවැති ජනාධිපතිවරණය ඔස්සේ එතුමිය යුද්ධය අවසන් කොට ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් ලබාදීමේ අවශ්‍යතාව අවධාරණය කළාය. මේ මැතිවරණ 4 ඔස්සේ කුමාරතුංග මැතිණියට ප්‍රශ්නය විසඳීමෙ ජනවරමක් ලැබුණි. ඉකුත් ජනාධිපතිවරණයේ දී මේ රටේ ජනතාව ජනවාර්ගික භේදයකින් තොරව 62.25 % ක ඓතිහාසික ජනවරමකින් කුමාරතුංග මැතිනිය බලයට පත් කළේ පැරණි වැරදි නිවැරදි කොට ප්‍රධාන වශයෙන්ම ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුමක් ලබාදීම සඳහාය. යුද්ධය අවසන් කොට සාමය ස්ථාපිත කරනු සඳහාය.


## සටහන්

# සටහන්

<u>සටහන්</u>

ජනාධිපති ලේකම් කාර්යාලය
2 6 AUG 2023
පුස්තකාලය

SCANNED



"මගේ ආණ්ඩුව ඉටු කළ පළමුවන කාර්යය වූයේ අපේ ජනතාව භුක්ති විඳින නිදහසේ මූලික හරයන්ට පහර නොවදින ලෙස කිසිම චකිතයකින් හෝ බියකින්, සැකයකින් හෝ තොරව කටයුතු කිරීමට අවස්ථාව උදා කිරීමයි. පුවත්පත් කලාවේදින්, වෘත්තිකයින්, වෘත්තීය සමිති නායකයින් සරසවි සිසුන් පමණක් නොව පාසැල් දරුවන් පවා මහ රෑ ඔවුන්ගේ නිවෙස් වලින් පැහැර ගෙන ගොස් ටයර් සෑයවල පුළුස්සා මරා දමන ලැබූ යුගය දැන් අවසන් වී ඇත.

තම පවුල්වල ආදරණීය සාමාජිකයින් යුධ පිටියේ දී නොව අමු අමුවේ මරා දමනු ලැබීම නිසා දහස් ගණනක පවුල් විඳින ශෝකය සහ වේදනාව ගැන මගේ ආණ්ඩුව තියුණු ලෙස සංවේදී බව මෙහි දී කියනු කැමැත්තෙමි"

Design and Concept - Dharma Wanninayake

Department of Government Information,
Lakshman Building,
321, Galle Road, Colombo 03.